**ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව - 2016**

-----------------------------------------------------

2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන සහ ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයෙහි ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13(1) වගන්තිය සහ 1961 අංක 28 දරන ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථා පනතේ 31 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14(2)(සී) වගන්තිය ප්‍රකාර සංස්ථාවේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත්කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ. පරිපාලිතයෙහි මූල්‍ය ප්‍රකාශන විගණන කටයුතු ක්‍රියාත්මක කිරීම සඳහා පොදු පරිචයේ යෙදෙන වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා විසින් ලබා ගන්නා ලදි.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

----------------------------------------------------------------

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

--------------------------

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (**ISSAI** 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූල වන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාල වන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරුකිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරුකිරීම්වලදී අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සංස්ථාවේ අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ තත්ත්වාගණනය කළ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

---------------------------------------------------

මෙම වාර්තාවේ 2.2 ඡේදයෙහි දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

----------------------

## 2.1 තත්ත්වාගණනය කළ මතය

--------------------------------------

**(අ) තත්ත්වාගණනය කළ මතය - ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව**

මෙම වාර්තාවේ 2.2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**(ආ) තත්ත්වාගණනය කළ මතය - සමූහය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ හා එහි පරිපාලිතයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්ය සාධනය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

## 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

---------------------------------------------

## 2.2.1 සමූහයේ මූල්‍ය ප්‍රකාශන

-------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශනයන් සැකසීමේදී සමාගම් අතර සිදුවන ගනුදෙනු ඉන් ඉවත් විය යුතුය. කෙසේ වෙතත් රු.මිලියන 39.66 ක් හා රු.මිලියන 1,104.15 ක ලැබිය යුතු ශේෂයන් හා ගෙවිය යුතු ශේෂයන් ඉන් ඉවත් කිරීමේදී යම් විෂමතාවයන් ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව හා ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.
විස්තර පහත දැක්වේ.

| අයිතමය | සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන ශේෂය | ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන ශේෂය | වෙනස |
|---|---|---|---|
| ---------------------- | ------------------- | ------------------------ | -------------- |
| | රු. මිලියන | රු. මිලියන | රු. මිලියන |
| ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙන් ලැබිය යුතු ශේෂය ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ගෙවිය යුතු ශේෂය | 302.87 | 263.21 | 39.66 |
| ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්තයට ගෙවිය යුතු ශේෂය ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවට ලැබිය යුතු ශේෂය | 3,589.44 | 4,693.59 | 1,104.15 |

(ආ) ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි පහත සඳහන් හේතූන් මත පදනම්ව තත්ත්වාගණනය කළ මතයක් එම මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් ප්‍රකාශ කරන ලදි.

**i.** විශ්‍රාම ගැන්වීමේ ප්‍රතිලාභ හා වෛද්‍ය ප්‍රතිලාභ සඳහා ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවේ සේවකයන් වෙනුවෙන් ලංකා ඛනිජතෙල් සංස්ථා සකසුරුවම් සමිතිය විසින් ගෙවන ලදි. මෙම සකසුරුවම් සමිතිය මඟින් විශ්‍රාම ගැන්වීමේ දී එහි සාමාජිකයන්ට අමතර බාග වැටුපක් සේවා වර්ෂ ගණනට ගෙවනු ලබයි. ඒ අනුව සකසුරුවම් සමිතිය සංස්ථාපනය මගින් **CPSTL** ආයතනයේ සේවකයන් හට පශ්චාත් සේවක ප්‍රතිලාභ හා සුදුසුකම් ලබන පශ්චාත් සේවක ප්‍රතිලාභ ශ්‍රී ලංකා ගිණුම්කරන ප්‍රමිත අංක 19 (**LKAS-19)** අනුව ආයුගණන ක්‍රමවේදයක් හා ගිණුම්ගත කිරීමක් සිදු කර නොතිබුණි.

**ii.** ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ලැබිය යුතු රු.මිලියන 4,857.2ක් වෙළෙඳ හා වෙනත් ලැබීම් තුල ඇතුලත්ව තිබුණි. ඉහත ශේෂය සම්බන්ධයෙන් ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථාවෙන් ලද ශේෂ සනාථ කිරීමේ ලිපියට අනුව රු.මිලියන 652 මතභේදයට තුඩු දෙනු ගනුදෙනු සිදු වී තිබුණි. (2015 රු.මිලියන 336) මෙයින් රු.මිලියන 163.5 (2015 රු.මිලියන 163.5) සඳහා හානිකරණය සිදු කර තිබුණි. ඒ අනුව හානිකරණ වෙන් කිරීම රු.මිලියන 489ක් (2015 රු. මිලියන 173) අඩුවෙන් සටහන් වී තිබුණි.

**iii.** 2017 සැප්තැම්බර් **07** දින පාර්ලිමේන්තුව විසින් අවසර ලබා දුන් දේශීය ආදායම් කෙටුම්පත අනුව 2018 අප්‍රේල් 01 දින සිට අදාල වන පරිදි සමාගම් සඳහා බදු අනුපාතය සියයට 28 වේ. මෙම කෙටුම්පත අනුව වෙන් කිරීම ගරු කථානායකතුමා සහතික කිරීම මත සිදු වේ. මෙම කෙටුම්පත් සම්බන්ධයෙන් ඇතිවන යම් බලපෑම් සම්බන්ධයෙන් මූල්‍ය ප්‍රකාශනයන්හි අනාවරණයක් සිදුකර නොතිබුණි.

## 2.2.2 සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශන

### 2.2.2.1 ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාවේ අසුභවාදී ශුද්ධ වත්කම් තත්ත්වය

**2016** වර්ෂය සඳහා මෙහෙයුම් කටයුතු වලින් රු.මිලියන **53,027** ක බදු පසු ශුද්ධ ලාභයක් සහ රු. මිලියන **53,137** ක මුළු විස්තීර්ණ ආදායමක් ලැබීම සහ සමාලෝචිත වර්ෂයේ අවසන් දිනට රු. මිලියන **185,847** ක ඍණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වයක් පැවතීම කෙරෙහි අවදානය යොමු කෙරේ. සමාලෝචනයට භාජනය වූ වර්ෂයේ විනිමය අනුපාතික විචලනයේ ඍණාත්මක බලපෑම සහ පසුගිය වසරවල සිදුවන හෙජිං ගනුදෙනුවල ප්‍රතිඵලයක් ලෙස සංස්ථාව විසින් දරනු ලැබූ අතිවිශාල පාඩු එම ඍණ ශුද්ධ වත්කම් තත්ත්වයට හේතු විය.කෙසේ වුවද සමාලෝචනයට භාජනය වූ වර්ෂය තුළ සංස්ථාවේ මූල්‍ය කාර්ය සාධනය වර්ධනය වී තිබුනද පසුගිය වසරවලදී පැවති අතිවිශාල පාඩු නිසා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තවදුරටත් ඍණ ශුද්ධ වත්කම් තත්ත්වය පැවතීමට හේතු විය.

### 2.2.2.2 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට (ශ්‍රීලංගිප්‍ර) අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) ශ්‍රී.ලං.ගි. ප්‍රමිති 19 - සේවක ප්‍රතිලාභ**

මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණු ගිණුම්කරණ ප්‍රතිපත්ති අංක 1.3 අනුව, ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරී ආයතනය විසින් සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාරවල **(SMEs)** භාවිතය සඳහා පමණක් අවසර දෙනු ලැබූ මෘදුකාංගය භාවිතයෙන් **ප්‍රක්ෂේපිත ඒකක ණය ක්‍රමය** යොදා ගෙන සංස්ථාව විසින් විශ්‍රාම ප්‍රතිලාභ පිරිවැය ගණනය කර තිබුණි. ඒ අනුව, ප්‍රමිතියේ සඳහන් නියමයන්ට අනුකූලව පාරිතෝෂිත සඳහා වෙන් කිරීම් සිදුකර නොතිබූ බව නිරීක්ෂණය විය.

**(ආ) ශ්‍රී.ලං.ගි. ප්‍රමිති 24 - සම්බන්ධිත පාර්ශව පිළිබඳ හෙළිදරව් කිරීම**

සංස්ථාව සහ ප්‍රධාන කළමනාකාර නිලධාරීන් අතර සම්බන්ධිත පාර්ශව මැදිහත්වීම මූල්‍ය ප්‍රකාශනවල නිසි ලෙස අනාවරණය කර නොතිබුණි.

### 2.2.2.3 ගිණුම්කරණ අඩුපාඩු

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) නිකුත් කළ නමුත් ගෙවීම් සඳහා ඉදිරිපත් නොවූ රු.මිලියන 989.9 ක වටිනාකමින් යුත් චෙක්පත් 581 ක වලංගු කාලය 2016 දෙසැම්බර් 31 දිනට ඉකුත් වී තිබුණි. තවද, ඉහත ඉදිරිපත් නොවූ චෙක්පත් අතර 2016 ජූනි 28 දින රේගු අධ්‍යක්ෂ ජනරාල් නමින් නිකුත් කළ රු. මිලියන 972.25 ක චෙක්පතක් ඇතුලත් වී තිබුණි.කෙසේ වෙතත් මේ සම්බන්ධව සුදුසු ගිණුම්කරන ප්‍රතිකර්ම යෙදීමට සංස්ථාව අපොහොසත් වී තිබුණි. මේ නිසා මුදල් හා අදාල වගකීම් ගිණුම් ඒම වටිනාකමට සමාන අගයකින් අඩුවෙන් සටහන් වී තිබුණි.

(ආ) ඒකාබද්ධ කිරීමේදී, අන්තර් ශාඛා ගනුදෙනු ඉවත් විය යුතු වේ. කෙසේ වෙතත් මූල්‍ය ප්‍රකාශන සමාලෝචනය කරන වර්ෂය අවසානයේදී අන්තර් ශාඛා වෙළඳ හා අනෙකුත් ලැබිය යුතු රු. 1,397,300 ක ශේෂයක් නිරීක්ෂණය කරන ලදි. එබැවින් මූල්‍ය ප්‍රකාශන තුල දැක්වෙන වෙලඳ හා අනෙකුත් ලැබීම් ශේෂය ඒ හා සමාන අගයකින් අධිතක්සේරු වී තිබුණි. එම නිසා විගණනයේදී අන්තර් ශාඛා ගිණුම් වාර්තා කිරීමේ හා පියවීමේ නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය පිළිබඳව විවේචනාත්මක සැකයක් මතු වේ.

(ඇ) මූල්‍ය ප්රකාශන තුල 2011/2012 සිට 2014/2015 දක්වා වන වර්ෂයන් සඳහා ආදායම් බදු තක්සේරු එකතුවක් වශයෙන් 2015 වර්ෂයේදී රු. 924,879,000 ක් දක්වා තිබුණි. කෙසේ වෙතත් විගණනය සඳහා ලබාදුන් තොරතුරු වලට අනුව එම කාලපරිච්ඡේදය තුල සැබෑ ආදායම් බදු තක්සේරුව රු. 1,409,169,766 ක් හා ඒ පිළිබඳ වූ දඩ අයකිරීම වශයෙන් රු 157,439,252 ක් විය. ඒ අනුව 2015 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වලට අනුව නොගෙවූ ආදායම් බදු සඳහා වෙන් කර ඇති ප්‍රතිපාදනය රු. 484,290,530 කින් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) විගණනයට සපයන ලද තොරතුරු වලට අනුව 2015 හා 2016 වර්ෂයන් සඳහා නොගෙවූ ජාතිය ගොඩනැගීමේ බදු මත දේශීය අදායම් දෙපාර්තමේන්තුව විසින් පනවන ලද අමතර තක්සේරු කල වටිනාකම රු 1,703,895,425කි. කෙසේ වෙතත් සලක බලන වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ජාතිය ගොඩනැගීමේ බදු ලෙස සඳහන් වූයේ රු 410,300,842ක ප්‍රමාණයකි. එබැවින් 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන වල ජාතිය ගොඩනැගීමේ බද්ද රු. 1,293,594,583ක් අඩුවෙන් පෙන්වා තිබුණි.

(ඉ) විගණනයට සැපයූ තොරතුරු අනුව 2016 වර්ෂයට නැව් පමා කුලිය වූ රු.353,737,477 ක වටිනාකම, උපචිත නැව් පමා කුලී රු. 173,504,644 කින් සහ ගෙවන ලද නැව් පමා කුලී රු. 180,232,833 කින් සමන්විත විය. කෙසේ වෙතත් සමාලෝචිත වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන අනුව රු. 173,504,644 ක උපචිත වටිනාකම පමණක් ගිණුම්ගත කර ඇත.

(ඊ) 2014 වර්ෂය තුලදී මහා භාණ්ඩාගාරයේ ඉල්ලීම මත විශේෂ ගාස්තුවක් ලෙස මහා භාණ්ඩාගාරයට ඛණිජ තෙල් නීතිගත සංස්ථාව රු. මිලියන 10,000 ක් ගෙවා තිබූ අතර එය 2014 වර්ෂයේ ආදායමට එරෙහිව කපා හැරිය යුතු වුවත් ඒ වෙනුවට ලැබිය යුතු ලෙස ගිණුම් ගත කර තිබුණි. ඒ අනුව, රු.මිලියන 250 , රු.මිලියන 750 හා රු.මිලියන 1,000 ක් පිළිවෙලින් 2014,2015 සහ 2016 වර්ෂ සඳහා ආදායමට එරෙහිව කපාහැර තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස ශුද්ධ මෙහෙයුම් ආදායම් එම වර්ෂ තුලදී අවතක්සේරු වී තිබුණි. වැරදි සහගත ගිණුම්කරණ පිළියම මගින් මූලික ගිණුම්කරණ මූලධර්ම උල්ලංඝනය කර තිබූ බව තවදුරටත් නිරීක්ෂණය විය.

(උ) ශ්‍රී ලංකන් ගුවන් සමාගම විසින් එකතුව රු මිලියන 160.5 ක නොපියවූ වවුචරවලට අදාල රු.මිලියන 6.7 ක පොළිය සලකා බලන වර්ෂයේදී ගිණුම්ගත කර නොතිබුණි.එහි ප්‍රතිඵලයක් වශයෙන් සලකා බලන වර්ෂයේදි උපචිත පොලිය හා ආදායම එම වටිනාකමෙන් අඩුවෙන් දක්වා තිබුණි.

**2.2.2.4 නොසැසඳුනු වෙනස්කම්**

-----------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) සංස්ථාවේ ගිණුම්පොත් අනුව පරික්ෂාවට භාජනය වූ වර්ෂය අවසානයේදී සකසුරුවම් සමිතිය වෙත ගෙවීමට තිබුණු ශුද්ධ වටිනාකම රු.7,600,745 කි. කෙසේ වෙතත් සකසුරුවම් සමිතිය ලබාදුන් ශේෂ තහවුරු කිරීම් වලට අනුව එම වටිනාකම රු.42,460,782

කි. එබැවින් රු.34,860,037ක නොසැසඳුනු ශේෂයක් මෙම වාර්තා දෙක අතර තිබුණු බව නිරීක්ෂණය විය.

(ආ) පිලිවෙලින් 2016 සහ 2015 වර්ෂ සඳහා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමෙහි මූල්‍ය ප්‍රකාශනවල පෙන්නුම් කළ තෙල් ගබඩා කිරීම හා බෙදා හැරීමේ ගාස්තු (පර්යන්ත ගාස්තු , ප්‍රවාහන ගාස්තු සහ පොළී ගෙවීම් ආදී) සඳහා රු. මිලියන **177** ක් සහ රු. මිලියන **400.9** ක් නොසැසඳුනු වෙනස්කම් නිරීක්ෂණය විය.

(ඇ) 2016 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන අනුව, සමාලෝචිත වර්ෂය සඳහා වෛද්‍ය වියදම් රු. 38,579,072 ක් වූ අතර විගණනයට ලබා දුන් විස්තරාත්මක උපලේඛණවලට අනුව එය රු. 57,951,039 කි. එබැවින් රු. 19,371,967 ක පැහැදිලි නොකළ වෙනසක් විගණනයේදී අනාවරණය විය.

(ඈ) වර්ෂ අවසාන ශේෂ සනාථ කිරීමට අනුව, 2007 සිට 2009 දක්වා කාල පරිච්ඡේදය අතරතුර තෙල් මිලදී ගැනීමට අදාලව සිදුව තිබූ ඉදිරි සුරකුම් ගනුදෙනු සම්බන්ධයෙන් එකතුව ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 22.77 ක් හා ඇමරිකා එක්සත් ජනපද ඩොලර් මිලියන 8.65 ක් පිළිවෙලින් මහජන බැංකුවට හා කොමර්ෂල් බැංකුවට ගෙවීමට තිබුණි.කෙසේ නමුත් එය සංස්ථාවේ ගිණුම්වලට ගෙන නොතිබුණි.

**2.2.2.5 විගණනය සඳහා සාක්ෂි නොවීම**

**---------------------------------**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) එකතු කළඅගය මත බදු

සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්වය පිලිබඳ ප්‍රකාශනයේ සඳහන් වෙනත් ලැබිය යුතු ශේෂය තුල එකතුවක් ලෙස ගත් විට එකතු කල අගය මත බදු (වැට්) රු.**623,573,943** ක් සඳහන් වූ අතර එම අගය තුල අයවිය යුතු වැට්, ආපසු ලබා ගත යුතු වැට් හා දේශීය මිලදීගැනුම් මත පිලිවෙලින් රු.**326,394,420,** රු.**124,733,322** හා රු.**172,446,201** ක් විය. කෙසේවෙතත් මේ සඳහා හේතුන් විගණනයට ඉදිරිපත් නොවිය. තවද එකතු කළ අගය මත බදු ලෙස අයවිය යුතු රු.**326,394,420** ක මුදල **2010** වර්ෂයේ සිට දිගින් දිගටම නිරවුල් නොවී තිබුණු බව හඳුනාගෙන තිබුණි. තවදුරටත් ආපසු ගෙවිය යුතු රු.**124,733,322** ක එකතු කළ අගය මත බදු මුදල තහවුරු කර ගැනීම සඳහා අදාල වන බදු ඉන්වොයිස් හා වෙනත් අදාල ආධාරක ලියවිලි ඉදිරිපත් නොවුණි.

තවද සංස්ථාවේ ගිණුම් පොත් වලට අනුව සාමාලෝචිත වර්ෂය තුලදී ජනනය වූ දේශීය මිලට ගැනුම් මත එකතු කළ අගය මත බදු ප්‍රමාණය රු.**172,446,201**කි. කෙසේ වෙතත් සාමාලෝචිත වර්ෂයට අදාලව අයකරගත යුතු එකතු කළ අගය මත බදු පිළිබඳව වාර්තා හෝ සංස්ථාව විසින් දේශීය ආදායම් දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කළ එකතු කළ අගය මත බදු වාර්තා වල සඳහන් ඉදිරියට ගෙන ගිය එකතු කළ අගය මත බදු සහ සාමාලෝචිත වර්ෂයට අදාළ බදු ඉන්වොයිසි විගණනයට ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය ප්‍රකාශනයන්ට අනුව අයවිය යුතු මුළු එකතු කළ අගය මත බදු හා ජාතිය ගොඩනැගීමේ බදු පිලිවෙලින් රු. **623,573,943**ක් හා රු.**1,803,656,120**ක් විය. කෙසේ වෙතත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ට අනුව එම අගයන් පිලිවෙලින් රු.**29,528,455**ක් හා රු.**2,831,220,633**ක් විය. එහෙයින් එම සංඛ්‍යාවන් අතර නොසැසඳුනු ශේෂයන් පිලිවෙලින් රු.**594,045,488**ක් හා රු.**1,027,564,513**ක් විය. තවද ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ට අනුව ගෙවිය යුතු එකතු කළ අගය මත බදු වටිනාකම රු.**3,336,528,365**ක් බව සඳහන් වුවද

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශනයන්හි ගෙවිය යුතු ශේෂයක් පෙන්නුම් නොකරයි. මේ සඳහා හේතු විගණනයට ඉදිරිපත් නොවිය.

(ඇ) මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව වර්ෂයේ ආර්ථික සේවා ගාස්තු සඳහා කිසිදු ලැබිය යුතු හෝ ගෙවිය යුතු ශේෂයක් දක්නට නොමැත. කෙසේ වෙතත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ට අනුව ගෙවිය යුතු ආර්ථික සේවා ගාස්තුව රු. **55,800,000** ක් බව අනාවරණය විය. එම නිසා මූල්‍ය ප්‍රකාශනයන්හි ආර්ථික සේවා ගාස්තු වලට අදාලව නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය විගණනයේදී සැක සහිත විය.

(ඈ) සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව සමාලෝචිත වර්ෂය අවසානයේ අය විය යුතු ශුද්ධ ආදායම් බදු ශේෂය රු.3,959, 861,589 කි. කෙසේ වෙතත් ආදායම් බදු දෙපාර්තමේන්තුවේ වාර්තාවන්ට අනුව ලැබිය යුතු බදු ශේෂය රු.6,443,430,012 කි. එහෙයින් මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව මුළු එකඟ නොවන ශේෂය රු.10,403,291,601කි. එම නිසා සමාලෝචිත වර්ෂය අවසාන මූල්‍ය තත්ත්වයේ ප්‍රකාශනයේ සටහන් වල විශ්වාසනීයත්ව භාවය, නිරවද්‍යතාවය හා සම්පූර්ණත්වය පිළිබඳව ගැටළු සහගත තත්ත්වයක් ඇති විය.

**(ඉ)** සංස්ථාවේ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයට අනුව ගෙවිය යුතු රේගු බදු රු.5,119,928,266 කි. කෙසේ වෙතත් ශ්‍රී ලංකා රේගුවේ වාර්තා අනුව එය රු.5,707,652,279 කි. එහෙයින් 2016 දෙසැම්බර් 31 වන දිනට මෙම වාර්තා දෙක අතර වෙනස රු.587,724,013 ක් බව විගණනයේ දී අනාවරණය විය.

**(ඊ)** සමාලෝචිත වර්ෂය අවසානයට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් අය විය යුතු ශේෂයන් තුල රු.1,511,857,999 ක ආදායම් බදු දක්වා තිබූ අතර, එහි සංයුතිය පහත පරිදි වේ.

| | මුදල |
|---|---|
| | --------------- |
| | රු. |
| වෙනත් අයවිය යුතු - ආදායම් බදු දෙපාර්තමේන්තුව | 376,000,065 |
| වෙනත් අය විය යුතු - ආදායම් බදු දෙපාර්තමේන්තුව / රේගු දෙපාර්තමේන්තුව | 1,135,857,934 |
| එකතුව | 1,511,857,999 |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

**(i)** ආදායම් බදු දෙපාර්තමේන්තුවට යොමු කළ බදු වාර්තා තුල ආදායම් බදු වැඩිපුර ගෙවීමක් හෝ ඉදිරියට ගෙන එන ලද ආදායම් බදු ශේෂයක් සඳහන් නොවීම.

**(ii)** මෙම සංඛ්‍යාවන් ඍජුවම වෙනත් අයවිය යුතු ආදායම් බදු දෙපාර්තමේන්තුව යටතේ වර්ග කිරීම විගණනයට පැහැදිලි නොවීය.

**(iii)** අනාවරණය වූ ශේෂයක් වන රු.376,000,065 දිගින් දිගටම 1998 වර්ෂයේ සිට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනයේ වෙනත් අයවිය යුතු ශේෂයන් තුල ඇතුලත් වුවකි. මෙහිදී එම ශේෂය දිගින් දිගටම පිය නොවී තිබීමට හේතුන් විගණනයට පැහැදිලි නොවීය.

**(iv)** ඉහත සඳහන් කළ වෙනත් අයවිය යුතු රු.1,135,857,934 ක ශේෂයක් 2012 වර්ෂයේ සිට ඉදිරියට ගෙන ආ ශේෂයක් වන අතර, අදාල තොරතුරු ඉදිරිපත් නොවීම නිසා සතුටුදායක ලෙස තහවුරු කර ගැනීමට නොහැකි විය.

එහෙයින් ඉහත සඳහන් කළ රු.1,511,857,999 ලැබිය යුතු එකතු ශේෂය සම්බන්ධයෙන් මා හට විශ්වාසනීයත්වය, නිවැරදි බව, තක්සේරු කල හැකි බව, සම්පූර්ණත්වය පිළිබඳව පිළිගත හැකි විශ්වාසයක් ලබා ගත නොහැකි වූ අතර, තහවුරු කර ගැනීමට ප්‍රමාණවත් විගණන සාක්ෂි නොතිබුණි.

(උ) මූල්‍ය ප්‍රකාශන වලට අනුව **2016** දෙසැම්බර් **31** දිනට උපචිත පොලි වියදම රු.**313,820,185**කි. කෙසේවෙතත් ලෙජරයට අනුව හර ශේෂය **04**ක එකතුවක් වූ රු.**1,617,112**කින්, බැර ශේෂය **31** ක එකතුවක් වූ රු.**13,763,193**කින් සමන්විත රු.**12,146,081**ක ශුද්ධ අගයක් විය. තවද**,** මෙම ශේෂය **2010** වසරේ සිට එකතුවෙමින් පැවති ශේෂයක් වන අතර ආධාරක තොරතුරු නොතිබීම නිසා මෙහි නිරවද්‍යතාව**,** පැවැත්ම හා සම්පූර්ණත්වය සම්බන්ධව සෑහීමකට පත්වීමට නොහැකි විය.

**2.3 ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්**

**2016** දෙසැම්බර් **31** දිනට ලැබියයුතු මුළු වෙළඳ ණය ප්‍රමාණය වූ රු.මිලියන **33,387** න් පිළිවෙලින් රු.මිලියන **24,136.8** ක් සහ රු.මිලියන **9,250.2** ක් රාජ්‍ය ආයතන වලින් හා පුද්ගලික ආයතන වලින් සමන්විත විය . කෙසේ වෙතත් පෙර වර්ෂයේ හිග හිටි ශේෂය වන රු. මිලියන **18,787** සමග සැසඳීමේදී වර්ෂය අවසානයේදී මුළු ලැබියයුතු දෑ සියයට **78** කින් වැඩි වී තිබුණි. **2016** දෙසැම්බර් **31** දිනට ලැබියයුතු දෑ වල කාල විශ්ලේෂණය පහත දැක්වේ.

| ගනුදෙනු වර්ගය | එකතුව | කාල විශ්ලේෂණය | | | | | |
|---|---|---|---|---|---|---|---|
| | | වර්ෂයකට අඩු | වර්ෂ 1සිට 2 දක්වා | වර්ෂ 2සිට 3 දක්වා | වර්ෂ 3සිට 4 දක්වා | වර්ෂ 4 සිට5 දක්වා | වර්ෂ 5ට වැඩි |
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. |
| බෙදුම්කරුවන් | 1,016,605,312 | 990,626,246 | (599,010) | 8,971,155 | 1,282,138 | 1,138,177 | 15,186,606 |
| ගුවන්සේවා | 9,263,688,816 | 9,257,815,945 | 217 | 38,394 | 1,803,327 | 1,617,303 | 2,413,630 |
| විදුලි ජනක පිරියත | 19,996,044,020 | 19,007,529,142 | 8,582,378 | 226,321,671 | 753,610,829 | - | - |
| රජයේ පාරිභෝගිකයන් | 2,002,371,035 | 1,312,981,322 | 31,856,507 | 480,596,958 | 61,454,860 | 49,270,208 | 66,211,176 |
| පුද්ගලික පාරිභෝගිකයන් | 628,092,693 | 316,810,086 | 23,670,804 | 21,653,010 | 22,533,993 | 25,412,079 | 218,012,717 |
| කෘෂි රසායනික | 17,001,940 | 7,782,212 | 1,997,458 | | 50,322 | 49,815 | 7,122,133 |

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| අනෙකුත් | 462,891,297 | 458,684,841 | - | - | - | 106,198 | 4,100,258 |
| **ඒකතුව** | **33,386,695,105** | **31,352,229,794** | **65,508,354** | **737,581,188** | **840,735,469** | **77,593,780** | **313,046,520** |

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් සිදු කෙරේ .

**(අ) කල් ඉකුත් වූ ශේෂ මත පොලී අයකිරීම්.**

(i) සංස්ථාව විසින් ණය කාලසීමාව ඉක්ම වූ ලැබිය යුතු ශේෂ මත පොලී අයකිරීම සිදුකරනු ලැබේ . කෙසේ වෙතත් සමාගමේ අධ්‍යක්ෂක මණ්ඩලය විසින් අනපේක්ෂිත කාලසීමාවක් තුල ගෙවීම් සිදුකිරීම පාලනය කිරීමට ගත් අකාර්යක්ෂම තීරණය හේතුකොට ගෙන සංස්ථාව විසින් පොලී ගාස්තු ගණනය කිරීමට විධිමත් පද්ධතියක් සැලසුම් කිරීම , ක්‍රියාත්මක කිරීම හා නඩත්තු කිරීම සිදු නොකර තිබූ බව නිරීක්ෂණය විය.

(ii) පෙර විගණන වාර්තා වල සඳහන් වූ පරිදි පොළී ගාස්තු අතින් ගණනය කිරීමේදී වැරදි සිදු වී ඇති බැවින් දත්ත ක්‍රියාවලි පද්ධතිය භාවිත කිරීමට යෝජනා කරන ලදී. කෙසේ වෙතත් සමාගම විසින් එවැනි පාලන දුර්වලතා නිවැරදි කිරීමට හිතකර ක්‍රියාමාර්ග නොගැනීම මත වැරදි , සමාලෝචිත වර්ෂය තුලදී නිරීක්ෂණය විය.

**(iii) 2015** වර්ෂයේ සිට බස්නාහිර පළාත් මාර්ග සංවර්ධන අධිකාරියෙන් ලැබියයුතු ශේෂය වූ රු. **31,207,680** මත පොළී අයකර නොතිබුණි.

**(ආ) ඉන්ධන සැපයිමේ ගිවිසුම්**

(i) සංස්ථාව විසින් ඉන්ධන සැපයීම සඳහා විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි. විශේෂයෙන්ම,2016 දෙසැම්බර් 31 දිනට මුළු ණයගැති ශේෂය තුල ඇතුලත් ප්‍රධාන ගණුදෙනුකරුවන් 17 දෙනෙකුගේ හිඟහිටි ශේෂය වූ රු.මිලියන 27,636 ක් හෝ සියයට 82 කට අදාළව ගිවිසුමකට එළඹ නොතිබුණි.එම නිසා සංස්ථාව වෙත නීත්‍යානුකූල අයිතිය අඩුවීම හේතුවෙන් පැහැරහැරීමේ අවදානම ඉහළ මට්ටමක පවතින අතර බේරුම්කරනයේ දී යම් ගැටළුකාරි තත්ත්වයක් ඇතිවීමටද හේතුවේ.

(ii) 2015 සැප්තැම්බර් 30 දින ශ්‍රී ලංකා එයාර් ලයින්ස් සමාගම විසින් දේශීය මුදලින් රු.මිලියන 7.9ක් එදිනට පැවති හිඟහිටි ශේෂය පියවීම සඳහා විදේශ විනිමය (ඇ.එ.ජ.ඩො) නොසලකා හරිමින් ගෙවන ලදී. ඉන් පසුව සංස්ථාව එම දිනයේ පැවති අනුපාතය අනුව එක්සත් ජනපද ඩොලර් බවට පරිවර්තනය කර ඇති අතර අවශ්‍ය ගැළපීම් ගිණුම් පොත් වල සිදු කරන ලදී .ඒ අනුව, පසුකාලීනව, ශ්‍රී ලංකා එයාර් ලයින්ස් සමාගම විසින් එම ගනුදෙණුව මත ඇතිවූ විනිමය ලාභය වූ රු. 307,063,541 මුදල ආදායම ලෙස නොසලකා කටයුතු කරන ලෙසත් සම්පූර්ණ මුදල (විනිමය ලාභය ඇතුළුව) අවසාන ගෙවීම ලෙස සලකන ලෙසත් සංස්ථාවෙන් ඉල්ලීමක් සිදුකරන ලදී. ඒ අනුව, පාර්ශව දෙක අතර ආයතන කොන්දේසිවලින් සමන්විත ණය ගිවිසුමක් නොතිබීම නිසා මෙවැනි ගැටළු ඇති වී තිබුණි.

තවද සංස්ථාව විසින් දල වශයෙන් පෙර හඳුනාගත් විනිමය ලාභය වූ රු.මිලියන 154 සමානව බෙදාගැනීමට එකඟවෙන ලදී. එසේ වුවත් මේ සම්බන්ධ ගැලපීම් මූල්‍ය ප්‍රකාශනවල සිදුකර නොතිබුණි.

(iii) දීගුකාලින හිගහිටි ශේෂ තිබියදී වුවද ඛනිජ තෙල් නිෂ්පාදන පාරිභෝගිකයන් වෙත අඛණ්ඩව සැපයූ බවට නිරීක්ෂණය විය. උදා: ලංකා ගමනා ගමන මණ්ඩලය,යාපනය - මාර්ග සංවර්ධන අධිකාරිය,ඛනිජ තෙල් කර්මාන්ත අමාත්‍යාංශයට ඛනිජ තෙල් නිෂ්පාදන කිණීම මගින් දිගුකාලීන හිගහිටි ශේෂ ලෙස පිළිවෙලින් රු.3,964,634 , රු.90,002,930 , සහ රු.6,243,570 තිබීම උදාහරණ ලෙස දැක්විය හැකිය.

**(ඇ) කෙටිකාලීන ණය**

සංස්ථාව විසින් ලබාගත් කෙටිකාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය සම්බන්ධයෙන් පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදු කරනු ලැබේ.

(i) වයස් විශ්ලේෂනයට අනුව, සමාලෝචිත වර්ෂය අවසානයේදී වටිනාකම රු.මිලියන 76,488.442 (ඇ.එ.ජ.ඩො. මිලියන 504.062) ක්, එනම් මුලු කෙටිකාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය වලින් සියයට 39 ක් ලබා දී තිබූ ණය කාලසීමාව ඉක්මවා තිබුණි. එයින්, සියයට 52 ක් ආසන්න වශයෙන් වසරක කාලයකට වඩා වැඩි කාලයක් 2016 දෙසැම්බර් 31 දින වන විටත් හිඟව පැවතුණි. 2015 ඔක්තෝබර් 01 සිට 2015 දෙසැම්බර් 31 දක්වා කාල පරාසය තුලදී එම කෙටිකාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය මහජන බැංකුවෙන් ලබාගෙන තිබුණි.

(ii) එකඟ වූ කාලසීමාව ඇතුලත එම ණය නොගෙවීම නිසා සංස්ථාවට ආසන්න වශයෙන් අමතර පිරිවැය රු. මිලියන 3,416 ක් පොලී ලෙස දැරීමට සිදුව තිබුණි. එම අමතර පිරිවැය වූයේ, 2016 දෙසැම්බර් 31 දිනට ණය කාල සීමාව අවුරුද්දක් ඉක්මවා ඇති කෙටිකාලීන විදේශ ව්‍යවහාර මුදල් ණය සඳහා පමණි. කෙසේ වුවද ගණනය කිරීම, සම්පූර්ණ ප්‍රමාද වීමේ කාල සීමාවටම සිදු කලේ නම් එම ණය ප්‍රමාද වී පියවීමේ මුලු පිරිවැය තවදුරටත් වැඩිවනු ඇත. සමාලෝචිත වර්ෂය ආරම්භයේදී ඉහත සඳහන් කළ ණය පොලී අනුපාතයට වඩා අඩු ප්‍රතිලාභයක් උත්පාදනය කරන කෙටිකාලීන ආයෝජන රු. මිලියන 63,763 ක් තිබූ බව තවදුරටත් අනාවරණය විය.

මේ සම්භන්ධයෙන් සංස්ථාවේ කළමණාකරන අධ්‍යක්ෂකවරයාගේ ප්‍රකාශය පහත පරිදි වේ. "***ඔවුන් ලබාදුන් විදේශ ව්‍යවහාර මුදල් ණය පියවීම සඳහා ප්‍රමාණවත් ඇ.එ.ජ.ඩො. ප්‍රමාණයක් මිලදීගැනීමට බැංකුවට හැකියාවක් නොමැත***". ඒ අනුව, ණය ලබාගැනීම් මුලාශ්‍රයක් තෝරා ගැනීම සඳහා සුදුසු නිරවුල්කිරීමේ සැලැස්මක් පැවැතීම. විශේෂයෙන්ඉහළ පොලී වියදමේ බලපෑම අවම කිරීම හා විනිමය අනුපාතිකය අවප්‍රමාණ හේතුවෙන් ඇතිවන අලාභ ගැටලු සහගත වේ.

**2.4 නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

විගණනයේදී නිරීක්ෂණය වූ නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම් පහත දැක්වේ.

| නීති ,රීති ,රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) යහපාලනය සඳහා රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ පිළිබඳ 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන රාජ්‍ය ව්‍යාපාර | |

චක්‍රලේඛය.

| | |
|---|---|
| **(i)** මාර්ගෝපදේශ **3.2** | සංස්ථාවේ අධ්‍යක්ෂ මණ්ඩලය සඳහා අවම වශයෙන් ඛනිජ තෙල් කර්මාන්ත ක්ෂේත්‍රයේ සිටින එක් ප්‍රවීනතාවයක් හෝ ඇතුලත්ව නොතිබුණි**.** |
| **(ii)** මාර්ගෝපදේශ 7.4.4 | ආයතනයේ මානව සම්පත් වල වෙනස්කම් පෙලට තබා ගැනීමට හැකිවීම, දේශීය හා විදේශීය සේවක ඵලදායිතාවය වැඩි දියුණු කිරීම සඳහා ජ්‍යෙෂ්ඨ කළමණාකරණ කමිටුවේ උපකමිටුවක් මඟින්, පුහුණු කමිටුවක් මඟින් පුහුණු අවශ්‍යතා ඇගයීමට ලක් කිරීම තවද. එම කමිටු දේශීය හා විදේශීය පුහුණු සඳහා පුද්ගලයින් තෝරා ගැනීමට ක්‍රියාපටිපාටියක් සකස් කල යුතුය. කෙසේවෙතත් එවැනි යාන්ත්‍රනයක් ක්‍රියාත්මක වී නොතිබුණි. |
| **(iii)** මාර්ගෝපදේශ 9.14 | සංස්ථාවේ A ශ්‍රේණිවල නිලධාරීන්ට හැර බඳවාගැනීමේ හා උසස් කිරීමේ පටිපාටිය කළමණාකරණ සේවා දෙපාර්තමේන්තුව මඟින් (MSD) අනුමත කර නොතිබුණි. |
| **(iv)** මාර්ගෝපදේශ **9.3.1** | ඉහල කළමණාකරන මට්ටමේ පුරප්පාඩු පිරවීමේදී අවදානම අවම කිරීමට විධිමත් අනුප්‍රාප්තික සැලැස්මක් සංස්ථාව නඩත්තු කර නොතිබුණි. |
| **(v)** මාර්ගෝපදේශ **9**.5.1 | පුහුණු සඳහා අයවැය සහ ඒ සඳහා ප්‍රතිපාදන වෙන් කිරීම පුහුණු කමිටුවක උපදෙස් පරිදි සකස් කල යුතුය. කෙසේ වෙතත් අද වන විටත් සංස්ථාව විසින් එවැනි පුහුණු අයවැයක් සකස් කර නොතිබුණි. |
| **(vi)** මාර්ගෝපදේශ **9**.5.4 | භාණ්ඩාගාර ලේකම්ගේ විශේෂ අනුමැතියකින් තොරව වානිජ සංස්ථාවක් විසින් අභ්‍යන්තරින් උත්පාදනය කළ අරමුදල් සහ රජයේ ප්‍රතිපාදන විදේශ පුහුණු සඳහා යොදා නොගත යුතුය. කෙසේ වෙතත් සංස්ථාව විසින් එසේ විශේෂ අනුමැතියක් මෙම මාර්ගෝපදේශයට අනුව ලබා ගෙන නොතිබුණි. |
| (ආ) 1997 ඔක්තෝබර් 24 දිනැති අංක 124 දරන මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශ චක්‍රලේඛය | පුරප්පාඩු වූ තනතුරක රාජකාරි ආවරණය කිරීම මාස **03** ක කාල සීමාවකට සීමා විය යුතුය. කෙසේ වුවද, කළමණාකරු (විමර්ෂණ), අලෙවි කළමණාකරු (සිල්ලර) , කළමනාකරණ සහකාර ප්‍රාදේශීය කළමනාකරු (මධ්‍යම) වැනි **A** ශ්‍රේණියේ තනතුරු **08** ක් ඇතුළුව පුරප්පාඩු තනතුරු සඳහා නිලධාරීන් **14** ක් **2016** දෙසැම්බර් **31** වන දිනට මාස 07 සිට වසර **3** ක් දක්වා කාලපරිච්ඡේදයක් සඳහා රාජකාරි ආවරණය කර තිබුණි. |
| (ඇ) 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී 03/2016 සහ 2013 නොවැම්බර් 04 දිනැති අංක එෆ්පී/06/35/02/01 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය. | සමාලෝචිත වර්ෂය සඳහා සේවකයින්ගේ වැටුප් වෙනුවෙන් සංස්ථාව විසින් රු. 152,690,099 ක උපයන විට ගෙවීම් බදු ඔවුන්ගේ වැටුපෙන් අඩු නොකොට එහි වියදමක් වශයෙන් දරා තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී | තෝරාගත් නියැදියට අනුව , අගය රු.මිලියන 3,652.74ක් වූ |

| | |
|---|---|
| ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය. මු.රෙ. 396 | චෙක්පත් 1,619ක් නිකුත් කල නමුත් බැංකුවට 2016 දෙසැම්බර් 31 වන විටත් දිගුකාලයක සිට බැංකුව ඉදිරිපත්කර නොතිබුණි.කෙසේවෙතත්,2017 ජුලි 27 වන විටත් එම චෙක්පත් සම්බන්ධයෙන් කිසිදු ප්‍රත්‍යයක්ෂ ක්‍රියාමාර්ගයක් ගෙන නොතිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

-------------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

-----------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, පසුගිය වර්ෂයේ බදු පෙර ශුද්ධ අලාභය වූ රු.මිලියන 19,885.780 ට එරෙහිව සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම් කටයුතු මගින් රු.මිලියන 69,553.681 ක බදු පෙර ශුද්ධ ලාභයක් ලබා තිබූ අතර ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයේ රු.මිලියන 89,439.461 ක වර්ධනයක් සිදු වී තිබුණි. ජාත්‍යන්තර වෙළඳපොළේ බනිජ තෙල් මිල ගණන්වල ස්ථාවර වීම නිසා ආනයන පිරිවැය ස්ථාවර වීම , දේශීය වෙළඳපොළේ බනිජ තෙල් ඉල්ලුම ඉහල යාම නිසා ඇතිවූ විකුණුම් වර්ධනය , 2016 වර්ෂයේ ඇ.එ.ජ.ඩොලරයට සාපේක්ෂව රුපියලේ අගය හීන වීමේ ප්‍රවනතාවය අඩුවීම හා ඉකුත් වර්ෂයට සාපේක්ෂව මූල්‍ය වියදම්වල අඩු වීම වැනි කරුණු මෙම ලාභයට හේතු වී තිබුණි. රු.මිලියන 69,553.681 ක බදු පෙර ලාභයට අමතරව සමාලෝචිත වර්ෂය තුලදී සංස්ථාව රු.මිලියන153,184 ක දායකත්වයක් රටට ලබා දී තිබූ අතර පෙර වර්ෂයේ එය රු.මිලියන 100,175 ක් විය.
මෙම වර්ධනය සාරාංශ ගතකර පහත දැක්වේ.

### 3.2 විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය

---------------------------------------

#### 3.2.1 ලාභදායීත්වය

------------------

සමාලෝචිත වර්ෂයේ සංස්ථාවේ මෙහෙයුම්වලින් සියයට 29.6 ක ආන්තිකයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේදී සියයට 11.75 ක් වූ ආන්තිකය සමඟ සැසඳීමේදී සියයට 17.85 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. එසේම, සමාලෝචිත වර්ෂයේදී දළ ලාභය ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ දළ ලාභය වූ රු. මිලියන 39,616 හා සැසඳීමේදී රු. මිලියන 57,004 කින් හෙවත් සියයට 144 කින් වැඩි වී තිබුණි.

මෙම වර්ධනය සාරාංශ ගත කර පහත දැක්වේ.


| විස්තරය | දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා | | වෙනස වාසිදායක/ (අවාසිදායක) | |
|---|---|---|---|---|
| | **2016** | **2015** නැවත සකසන ලද | | |
| | **රු. මිලියන** | **රු. මිලියන** | **රු. මිලියන** | **ප්‍රතිශතය** |
| ආදායම | 423,061 | 376,734 | 46,327 | 12 |
| විකුණුම් පිරිවැය | (326,441) | (337,118) | 10,677 | 3 |
| **දළ ලාභය** | **96,620** | **39,616** | 57,004 | 144 |
| අනෙකුත් ආදායම් | 3,589 | 4,234 | (645) | (15) |
| විකිණීමේ හා බෙදා හැරීමේ වියදම් | (14,412) | (13,401) | (1,011) | (7.5) |
| පරිපාලන වියදම් | (4,384) | (3,592) | ( 792) | (22) |
| **මෙහෙයුම් ලාභය** | **81,413** | **26,857** | 54,556 | 203 |
| විනිමය අනුපාත වෙනස්වීම් | (8,829) | (32,841) | 24,012 | 73 |
| මූල්‍ය වියදම් | (11,404) | (15,049) | 3,645 | 24 |
| මූල්‍ය ආදායම් | 8,374 | 5,011 | 3,363 | 67 |
| සුරැකුම් වියදම් | - | (3,864) | 3,864 | 100 |
| **ආදායම් බදු පෙර ලාභය/(පාඩුව)** | **69,554** | **(19,886)** | **89,440** | **450** |

### 3.2.2 ශුද්ධ ලාභය/(අලාභය)ට එරෙහිව ශුද්ධ වත්කම්

2016 වර්ෂය සහ ඉකුත් වර්ෂ පහ සඳහා සංස්ථාවේ ශුද්ධ ලාභය/(පාඩුව) හා ශුද්ධ වත්කම් තත්ත්වය පහත සඳහන් වගුවෙහි හා රූප සටහනෙහි දැක්වේ.

| වර්ෂය | ශුද්ධ ලාභය/(අලාභය) | වර්ෂය අවසානයට ශුද්ධ වත්කම් තත්ත්වය |
|---|---|---|
| ------------- | ------------------------ | --------------------------- |
| | රු. මිලියන | රු. මිලියන |
| 2011 | (94,357) | (131,236) |
| 2012 | (97,181) | (228,545) |
| 2013 | (7,889) | (236,467) |
| 2014* | 1,129 | (232,257) |
| 2015* | (20,681) | (228,985) |
| 2016 | 53,027 | (185,847) |

*නැවත සකසන ලද




**3.2.3 වැදගත් ගිණුම්කරණ අනුපාත**

----------------------------------------

ලැබී ඇති තොරතුරු අනුව, සංස්ථාවේ සමාලෝචිත වර්ෂය හා ඉකුත් වර්ෂය සඳහා වැදගත් ගිණුම්කරණ අනුපාත කිහිපයක් පහත දැක්වේ.

| අනුපාත | 2016 | 2015 නැවත සකසන ලද |
|---|---|---|
| **ලාභදායිත්ව අනුපාත** | | |
| දළ ලාභ අනුපාතය (%) | **22.84** | **10.52** |
| මෙහෙයුම් ලාභ අනුපාතය (%) | **19.24** | **7.13** |
| ශුද්ධ ලාභ/(අලාභ) අනුපාතය (%) | **12.53** | **(5.45)** |
| **ද්‍රවශීලතා අනුපාත** | | |
| ජංගම වත්කම් අනුපාතය (වාර ගණන) | **0.34:1** | **0.31:1** |
| ක්ෂණික වත්කම් අනුපාතය (වාර ගණන) | **0.24:1** | **0.21:1** |
| කාරක ප්‍රාග්ධනය (රු. මිලියන) | **(249,297)** | **(295,098)** |
| **ආයෝජන අනුපාත** | | |
| වත්කම් මත ප්‍රතිලාභ (%) | **27.82** | **(10.4)** |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) දළ ලාභ අනුපාතිකය සහ ශුද්ධ ලාභය අනුපාතය පසුගිය වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂය තුළ පිළිවෙළින් සියයට **12.33** හා සියයට **17.98** ක ප්‍රතිශතයකින් වර්ධනය වී තිබුණි.

(ආ) **2016** වර්ෂයේ දී ඛනිජ තෙල් සංස්ථාවේ සෘණ කාරක ප්‍රාග්ධන තත්ත්වය පසුගිය වසරට සාපේක්ෂව සියයට **6** කින් වර්ධනය වී තිබුණි. මෙම ධනාත්මක තත්ත්වයට හේතු වූ ප්‍රධාන සාධක වූයේ වෙළඳ හා වෙනත් ලැබීම්,කෙටිකාලීන ආයෝජන වර්ධනය වීම සහ ණය ගැනීම් අඩු වීමයි.

## 4 මෙහෙයුම් සමාලෝචනය

### 4. 1 කාර්යසාධනය

(අ) සංස්ථාවේ ඇතිවී තිබුණු මූල්‍ය දුෂ්කරතාවලට මුහුණ දීම සඳහා 2014 සැප්තැම්බර් දක්වා ඛනිජ තෙල් නිෂ්පාදනවල දේශීය සිල්ලර මිල ගණන් අඛණ්ඩව ඉහළට සංශෝධනය කර තිබුණි. එසේම ජාත්‍යන්තර ඉන්ධන මිල අඩු වීමට සාපේක්ෂව 2014 වර්ෂය තුළදී දෙවරක් හා 2015 වර්ෂය තුළදී එක් වරක් මිල ගණන් අඩු කර තිබුණි. එසේ වුවද, ජාත්‍යන්තර වෙළඳ පොලේ සත්‍ය මිල අඩු වීම ඉහත මිල වෙනස් වීම් තුළින් සම්පූර්ණයෙන් පෙන්නුම් නොකෙරුණි. තවද පහත දැක්වෙන ඛණිජ තෙල් නිෂ්පාදනයන්ගෙන් සමාලෝචිත වර්ෂයේදී හා පසුගිය වසර 04 ක කාල සීමාව තුල සංස්ථාව අඛණ්ඩව පාඩු ලබා තිබුණි.

| අංශය | වර්ෂය සඳහා ශුද්ධ අලාභය | | | | |
|---|---|---|---|---|---|
| | 2016 | 2015 | 2014 | 2013 | 2012 |
| | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන | රු.මිලියන |
| **විදුලිබල උත්පාදන** | | | | | |
| දැවි තෙල් 1500 | - | 252 | 299 | 1,240 | 34,959 |
| **කර්මාන්ත හා දේශීය** | | | | | |
| දැවි තෙල් 1500 | - | 262 | 69 | 350 | 2,003 |
| දේශීය භූමිතෙල් | 2,982 | 3,860 | 2,715 | 2,449 | 3,525 |
| **අපනයන** | | | | | |
| නැප්තා | 1,580 | 827 | 1,799 | - | - |
| දැවි තෙල් | 727 | 5,346 | 1,627 | - | - |
| **නැව් තෙල්** | | | | | |
| දැවි තෙල් | 68 | - | - | - | - |

තවදුරටත් සංස්ථාව රු. මිලියන 8,251 ක් හා රු. මිලියන 1,291 ක අලාභ පිළිවෙලින් පෙට්‍රල් 92 ඔක්ටේන් හා පෙට්‍රල් 95 ඔක්ටේන් සඳහා දරා තිබුණි.

**2016 වසර සඳහා ඛනිජතෙල් නිෂ්පාදන මත ලාභදායිත්වය (ලීටරයකට)**

| නිෂ්පාදනය | විකුණුම් මිල ලීටරයකට | ගනුදෙනුකරුගේ කොමිස් මුදල හැර විකුණුම් ආදායම ලීටරයකට | විකුණුම් පිරිවැය ලීටරයකට | දල ලාභය ලීටරයකට | පිරිවැයෙහි අන්තර්ගත සම්පූර්ණ බදු වටිනාකම ලීටරයකට | මුළු පිරිවැය ලීටරයකට | ශුද්ධ *ලාභය/* (අලාභය) ලීටරයකට | සමස්ථ ශුද්ධ ලාභය/ (අලාභය) වසරට |
|---|---|---|---|---|---|---|---|---|
| | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. | රු. මිලියන |
| පෙට්‍රල් 95 | 128.00 | 124.15 | 95.29 | 28.86 | 67.87 | 133.06 | **(8.91)** | (1,291) |
| පෙට්‍රල් 92 | 117.00 | 113.49 | 84.29 | 29.20 | 57.89 | 120.84 | **(7.35)** | (8,251) |
| ඔටෝ ඩීසල් | 95.00 | 92.83 | 60.37 | 32.46 | 17.22 | 76.02 | **16.81** | 31,128 |
| සුපර් ඩීසල් | 110.00 | 107.20 | 66.46 | 40.74 | 24.93 | 83.62 | **23.58** | 1,761 |

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| භූමිතෙල් | 49.00 | 47.77 | 56.38 | (8.61) | - | 65.59 | **(17.82)** | (2,982)* |

* භූමිතෙල් සහනාධාරය වශයෙන් රු.මිලියන 2,982ක් වූ භූමිතෙල් අලාභය භාණ්ඩාගාරයෙන් ලැබියයුතු සහනාධාරයක් ලෙස මූල්‍ය ප්‍රකාශනවල ගිණුම්ගත කර තිබුණි.

(ආ) ද්‍රව ගෑස් විකිණීම සම්බන්ධයෙන් පුද්ගලික ගෑස් සමාගමක් සහ සංස්ථාව අතර ගිවිසුමක් අත්සන් කරන ලද අතර 2006 ඔක්තෝබර් 20 දින කල් ඉකුත් වී තිබිණි. පසුගිය විගණන වාර්තා වල සඳහන් පරිදි ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් එම සමාගමට ද්‍රව ගෑස් වායුව සපයා තිබුනේ නව ගිවිසුමක් අත්සන් කිරීම හෝ කලින් එකඟතාව අලුත් කිරීමකින් තොරවය. ඊට අමතරව, ඛනිජ තෙල් නීතිගත සංස්ථාව සමඟ ගිවිසුමකට නොඑළඹි වෙනත් පුද්ගලික සමාගමකට ද්‍රව ගෑස් වායුව සපයා තිබුණි.

## 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

**--------------------------------------------**

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

### (අ) ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය(ERP)

**(i)** ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) විසින් හඳුන්වා දෙන ලද ව්‍යවසාය සම්පත් සැලසුම් පද්ධතිය (ERP) පිළිබඳව අදාළ පාර්ශවයන්ගේ වගකීම් සම්බන්ධයෙන් සංස්ථාව, ලංකා ඛනිජතෙල් ගබඩා පර්යන්ත සමාගම සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම අතර ගිවිසුමක් හෝ අවබෝධතා ගිවිසුමක් නොතිබූ බව නිරීක්ෂණය විය. එසේම, මෙම පද්ධතිය විශේෂයෙන් ඉන්ධන තොග සමාලෝචනය කිරීමේ කටයුතු සඳහා ප්‍රමාණවත් ලෙස උපයෝජනය කර නොතිබුණි.

### (ආ) මාසික උපයෝගිතා ගාස්තු (MUF) අය කර ගැනීම

2013 ඔක්තෝබර් 29 දින නිකුත් කරන ලද අංක 38/1140 දරණ අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුව, 2014 ජනවාරි 01 දින සිට ක්‍රියාත්මක වන පරිදි සංස්ථාව සතු බෙදාහරින්නන්ගේ (CODO) ඉන්ධන පිරවුම්හල් හා භාණ්ඩාගාරය සතු (TODO) බෙදාහරින්නන්ගේ ඉන්ධන පිරවුම්හල් වලින් මාසික උපයෝගිතා ගාස්තු අයකර ගැනීම සඳහා අනුමැතිය ලබා දී තිබුණි. කෙසේ වෙතත් වහාම ක්‍රියාත්මක වන පරිදි මාසික වෘත්තීමය ගාස්තු (MOR) ගෙවන බෙදා හරින්නන්ගෙන් ද මාසික උපයෝගිතා ගාස්තු (MUC) අය කල යුතුය. එම නිසා පසුගිය වර්ෂය තුල (මාස 12ක කාල සීමාව තුල) උපයන ලද සාමාන්‍ය මාසික කොමිස් මුදලෙන් මාසික සියයට 35ක ප්‍රතිශතයක් MUF ලෙස ගණනය කල යුතුය. තවදුරටත් කුඩා පරිමාණ බෙදාහරින්නන්ගේ පැවැත්ම උදෙසා පහත ආකාරයට අඩු කිරීම් ප්‍රදානය කර තිබුණි.

| මාසික කොමිස් වර්ගය | අඩු කිරීම් ප්‍රතිශතය |
|---|---|
| රු.500,000ට අඩු | 70 |
| රු.500,001 – රු.1000,000 | 50 |
| රු.1,000,001 – රු.1,500,000 | 25 |
| රු.1,500,001ට වැඩි | 0 |

මාස 13කට වැඩි සැලකිය යුතු ප්‍රමාදයකින් පසුව අලෙවි කළමණාකාර (සිල්ලර) විසින් අධ්‍යක්‍ෂ මණ්ඩල පත්‍රිකා අංක 2014 දෙසැම්බර් 11 දින අංක 16/1154 හරහා අධ්‍යක්‍ෂ මණ්ඩලයට දැනුවත් කර තිබුණි. "***2014 ජනවාරි 01 දින සිට මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම පිළියෙල කිරීමේ ප්‍රමාදයක් නිසා ප්‍රායෝගික නොවේ. CODO ගිවිසුම් අවසන් කිරීමේ කටයුතු සම්පූර්ණ කරමින් පවත්නා අතර එම කටයුතු අවසන් වූ වහාම CODO/TODO යන දෙවර්ගයේ ම බෙදාහරින්නන් සඳහා මෙම යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීමට අලෙවිකරන අංශය අපේක්ෂා කරයි.***"

කෙසේ වෙතත් ,අධ්‍යක්ෂක මණ්ඩලය විසින් **2016** පෙබරවාරි **16** දින අධ්‍යක්ෂක මණ්ඩල පත්‍රිකා අංක **11/1179** මගින් අදාල ගිවිසුම් සඳහා අවශ්‍ය ගැලපුම් සිදුකිරීමට අනුමැතිය ලබා දී ඇති අතර ඉහත සඳහන් කළ ප්‍රභේදයන් දෙවර්ගයටම අදාල බෙදාහරින්නන්ගෙන් ( **2016** වර්ෂය සඳහා මාසික උපයෝගීතා ගාස්තු අයකර ඇත්තේ 2016 බෙදාහරින්නන් **248** දෙනෙකු අතරින් **11** දෙනෙකුගෙන් පමණි.) **2017** ඔක්තෝබර් **31** තෙක්ම මාසික උපයෝගීතා ගාස්තු අයකිරීමට පියවර ගෙන නොතිබුණි. මෙම අධ්‍යක්ෂ මණ්ඩල තීරණයට අනුකූල නොවීම හේතුවෙන් **2014** වර්ෂයේ සිට සංස්ථාව වසරකට රු. මිලියන **300** ට වැඩි පාඩුවක් දැරීමට සිදු වී තිබුණි.

**(ඇ) වෛද්‍යාධාර යෝජනාක්‍රමය**

විගණනයට සපයන ලද තොරතුරු වලට අනුව**,** සීමාසහිත ලංකා ඛනිජතෙල් සේවක සකසුරුවම් සමිතිය **(CPCTSL) 1981** දෙසැම්බර් **31** දින සමිති ආඥා පනතේ 123 (3) (අ) වගන්තිය යටතේ ලියාපදිංචි කර තිබූ අතර එය ලාභ නොලබන සංවිධාන සඳහා වූ නිර්දේශිත පොදු පරිචය පිළිබඳ ශ්‍රී ලංකා ප්‍රකාශයේ නිර්වචනයට අනුව ලාභ නොලබන ආයතනයක් (රාජ්‍ය නොවන සංවිධාන) ලෙස ක්‍රියාත්මක වෙමින් පවතී. ලංකා ඛනිජ තෙල් සංස්ථාව සහ ලංකා ඛනිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම යන ආයතන දෙකේම සියලුම ස්ථිර සේවකයින් සකසුරුවම් සමිතියේ සාමාජිකයන් වේ. සකසුරුවම් සමිතියේ මූලික අරමුණු වන්නේ විශ්‍රාම ප්‍රතිලාභ සැපයීම,සාමාජිකයින්ගේ මරණය සිදුවන අවස්ථාවලද ඥාතීන්ට මූල්‍ය ආධාර ලබා දීම**,** සුදුසුකම් සහිත පවුලේ සාමාජිකයින් මිය යාමකදී සාමාජිකයන්ට මූල්‍ය ආධාර ලබාදීම**,** වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය යටතේ මූල්‍ය ආධාර ලබාදීම සහ ණය පහසුකම් සාමාජිකයින්ට ලබාදීම වේ.

සකසුරුවම් සමිතිය විසින් එහි සාමාජිකයින් ලෙස සංස්ථාවේ හා තොග ගබඩා පර්යන්ත සමාගමේ සේවකයින් පහත ප්‍රධාන ප්‍රතිලාභ ලබා දෙනු ඇත.

**(i)** විශ්‍රාම ප්‍රතිලාභ ගෙවීම (සෑම සම්පූර්ණ කරන ලද සේවා වර්ෂයක් සඳහාම අර්ධ මාසික වේතනයක්)

**(ii)** සංස්ථාව හා තොග ගබඩා පර්යන්ත සමාගම වෙනුවෙන් වෛද්‍යාධාර යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කිරීම.

සකසුරුවම් සමිතියේ ශුද්ධ ඌණතාවයකට දායක වූ 2015 වර්ෂය අවසානයේ දී පැවැති රු.1,473,714,266 ක් වූ ඍණාත්මක සමුච්චිත සංචිත හේතුවෙන් වෛද්‍ය ප්‍රතිලාභ යෝජනා ක්‍රමය අඛණ්ඩව ක්‍රියාත්මකවීමට නොහැකි බව 2016 පෙබරවාරි 23 දින පැවැති රැස්වීම් වාර්තාවේ සඳහන් විය. අනතුරුව**,** 2016 අගෝස්තු 11 දිනැති අංක 08/1186 දරණ අධ්‍යාක්‍ෂක මණ්ඩල තීරණය අනුව**,** වෛද්‍යාධාර යෝජනා ක්‍රමය කළමණාකරනය කිරීම සංස්ථාව විසින් 2016 ජුලි 01 සිට අඛණ්ඩව ක්‍රියාත්මක කිරීම සහ මූලික හිමිකම් ලබාදීම සඳහා වැය වන පිරිවැය මාස 06ක කාලයක් හෝ සුදුසු වෛද්‍ය රක්ෂණ සපයන්නෙකු තෝරා ගන්නා තෙක් සංස්ථාව විසින් දරා ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි.

වෛද්‍යාධාර යෝජනා ක්‍රමය සම්බන්ධ පහත දැක්වෙන නිරීක්ෂණයන් සිදු කරන ලදි.

**(i)** සකසුරුවම් සමිතිය පිළිබඳව 2017 ජුලි 19 දින කැඳ වූ තොරතුරු සම්බන්ධයෙන් සිහි කැඳවීම් දෙකක් නිකුත් කර තිබුණද විගණනය සඳහා ඉල්ලුම් කළ තොරතුරු සංස්ථාව ලබා දී නොතිබුණි. සකසුරුවම් සමිතිය සමඟ ඇති ගණුදෙනු හා ඉල්ලුම් කළ තොරතුරු ලබා නොදීමේ හේතුවෙන් විගණනයේ දී සැක සහිත තොරතුරු ලබා නොදීමේ හේතුන් විගණනයේ දී සැක සහිත විය.

**(ii)** 2016 අගෝස්තු 11 දින අංක 08/1186 දරන අධ්‍යක්‍ෂ මණ්ඩල තීරණය අනුව, වෛද්‍යාධාර ක්‍රමය කළමණාකරනය කිරීම සංස්ථාව විසින් 2016 ජුලි 01 සිට අඛණ්ඩව ක්‍රියා කිරීමට තිබියදීත්, වෛද්‍යාධාර යෝජනා ක්‍රමය කළමණාකරනය කිරීමට කිසිදු ප්‍රතිපත්තියක් හෝ ක්‍රියාපටිපාටියක් මේ දක්වා විගණනයේ දී අනාවරණය නොවිය. තවදුරටත් එම මණ්ඩල තීරණයට පටහැනිව 2016 ජුලි 01 දිනෙන් පසුව කාලච්ඡේදය සඳහා සම්බන්ධ අගය රු.41,237,505 ක වෛද්‍ය බිල්පත් සකසුරුවම් සමිතිය විසින් සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය කර ගෙන තිබුණි.

**(ඇ) තෙල් ප්‍රවාහන නල මාර්ග ජාලය**

කොළඹ වරාය සිට කොලොන්නාව ඛණිජතෙල් ගබඩා පර්යන්තය දක්වා පෙට්‍රල්, ඩීසල්, භූමිතෙල් සහ දැවිතෙල් වැනි ඛණිජ තෙල් නිමි නිෂ්පාදිත ප්‍රවාහනය කිරීමට දශක කිහිපයකට පෙර ස්ථාපනය කළ නල මාර්ග අළුත්වැඩියා කළයුතු තත්ත්වයේ පවතින අතර ඉන් නල මාර්ග කිහිපයක් අළුත්වැඩියා කිරීමට නොහැකි තත්ත්වයට දිරාපත්වීම හේතුවෙන් දැනටමත් අත්හැර දමා තිබුණි. ඛනිජ තෙල් නිෂ්පාදනවල ජාතික අවශ්‍යතාවයෙන් විශාල ප්‍රමාණයක් මෙම දිරාපත් වූ නල මාර්ග තුලින් කොලොන්නාව ඉන්ධන ගබඩා පර්යන්තයට ගෙන යන බැවින් මෙම නල මාර්ග අළුත්වැඩියා කිරීම හා නවීකරණය කිරීම වහා කළ යුතු අවශ්‍යතාවයක් වී ඇත. එම අබලන් වූ නල මාර්ග තුලින් ආනයනික පිරිපහදු කළ ඛනිජ තෙල් නිෂ්පාදන ප්‍රවාහනය කිරීම නිසා උග්‍ර ඉන්ධන අර්බුදයක් සමඟ මුළු රටම අකර්මණ්‍ය වීමේ අවදානම විගණනයේදී බැහැර කළ නොහැක.

මේ සම්බන්ධව සංස්ථාවේ සභාපතිවරයා පහත පරිදි අදහස් දක්වා තිබුණි.

***"පිළිවෙලින් විෂ්කම්භය අඟල් 18 හා අඟල් 14 සහිත මාරුකිරීමේ නල 02 ක් ඉදිකිරීමට ටෙන්ඩර් කැඳවීමට පියවර ගෙන ඇත.මෙම නල ඩොල්ෆින් ටැංකර් බර්ත්(DTB) සිට ආරම්භ කර (නව ලෝඩින් ආර්ම් දෙකක් සහිත ) ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගමේ (CPSTL) කොලොන්නාව තෙල් ස්ථාපිතයෙන් අවසන් වේ. මීට අමතරව, මේ වන විට අලුත්වැඩියා කරමින් පවතින අඟල් 12 නලයද, Horizontal Drillings අවශ්‍යකරන කොටස් සිදුකර සම්පූර්ණ කරයි."***

මුතුරාජවෙල පර්යන්තයේ සිට කි.මී. 7.2ක් හා මුහුදු වෙරළේ සිට කි.මී. 6ක් පමණ දුරින් මුහුද මැද පිහිටුවා ඇති සිංගල් පොයින්ට් බෝයි මූරින් පහසුකම මාර්ගයෙන් මුතුරාජවෙල ස්ථාපිතයට සැපයීම් සිදු කෙරෙන අතර, මුහුදු රළ තත්ත්වය ඉතා දැඩිවන අවස්ථාවලදී හෝ අදාල පහසුකම පිළිබඳ නඩත්තු කටයුතු සිදුවන අවස්ථාවලදී වෙනත් විකල්ප සැපයුම් මාර්ගයක් නොවිය. නිෂ්පාදිත අන්තර් පර්යන්ත මාරු කිරීම සඳහා මුතුරාජවෙල පර්යන්තය හා කොලොන්නාව ස්ථාපිතය අතර සම්බන්ධකමක් නොවීම හේතුවෙන් එම පර්යන්ත දෙකෙහිම ප්‍රශස්ථ උපයෝජනයට බාධා මතුවී තිබුණි.

"රට හරහා නල මාර්ග ව්‍යාපෘතිය" ක්‍රියාත්මක කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය 2012 සැප්තැම්බර් 13 දින ලබා දී තිබුණද, එම ව්‍යාපෘතිය සමාලෝචිත වර්ෂය අවසානය දක්වා ක්‍රියාත්මක කර නොතිබුණි. කොළඹ වරායේ සිට කොලොන්නාව පර්යන්තය දක්වා දිවෙන රට හරහා නල මාර්ග ව්‍යාපෘතියේ වර්තමාන තත්ත්වය පහත දැක්වේ.

| නලයේ ප්‍රමාණය (අඟල්) | නිෂ්පාදනය | වත්මන් තත්ත්වය |
|---|---|---|
| 10 | ඩීසල් | ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |
| 10 | අනෙකුත් පිරිපහදු කළ ඉන්ධන (**Other White Oil**) | අක්‍රීයව පවතී |
| 10 | නැප්තා | අක්‍රීයව පවතී |
| 12 | නැප්තා | අක්‍රීයව පවතී. **CPSTL** ආයතනය විසින් ප්‍රතිස්ථාපනය කරමින් පවතී. |
| 14 | දැවිතෙල් | ක්‍රියාත්මක තත්ත්වයේ පවතී. |

සංස්ථාවේ වාර්තාවන්ට අනුව නල පද්ධතියෙහි ඇති කාන්දුවීම් (**PLT**) හේතුවෙන් සහ පමාකුලී අයකිරීම් නිසා සලකා බලන වර්ෂයේදී සංස්ථාවට දැරීමට සිදු වී තිබූ මුළු පිරිවැය රු. 1,096,304,695 ක් වූ අතර මේ තුල අන්තර්ගත නල පද්ධතියෙහි ඇති කාන්දුවීම් නිසා හටගත් අලාභය වන රු.173,504,644 දැරීමට සිදු වී තිබුණේ ප්‍රධාන වශයෙන්ම නල පද්ධතියෙහි ඇති ගැටලු සහගතතත්ත්වයන් හේතුවෙනි. මාගේ පසුගිය විගණන වාර්තාවලින්ද මෙම අඩුපාඩු පිළිබඳව කිහිපවරක්ම පෙන්වා දුන්නත් සංස්ථා කළමනාකාරිත්වය විසින් නල පද්ධතිවල ගැටලු සහගත තත්ත්වයන්ගෙන් ඇතිවන අලාභ අවම කර ගැනීමට සාධනීය ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

**(ඇ) ත්‍රිකුණාමලයේ තෙල් ගබඩා ටැංකි සංකීර්ණය**

ඝණ මීටර 12,500(මෙට්‍රික් ටොන් 10,000) ධාරිතාවයෙන් යුත් තෙල් ටැංකි 100කින් සහ වෙනත් පහසුකම්ද ඇතුලත්ව 1930 දි මෙය ඉදිකර තිබුණි. වපසරියෙන් හෙක්ටයාර් 358.553ක් වන අතර තෙල් ටැංකි සංකීර්ණය ශ්‍රී ලංකා රජය විසින් බ්‍රිතාන්‍යය රජයේ නාවික කොමසාරිස්වරුන්ට වසර 999ක බද්දකට නිදහසට පෙර ලබා දී තිබුණි.1961 දී ශ්‍රී ලංකා රජයේ ඉල්ලීම මත ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ස්ටර්ලින් පවුම් 250,000ක් වාරික තුනකින් ගෙවීමෙන් අනතුරුව ඉඩම, ටැංකි සංකිර්ණය,ගොඩනැගිලි සහ අනෙකුත් පහසුකම් පිළිබඳ හිමිකම 1964 අප්‍රේල් 01 දින සිට පවරා ගන්නා ලදී. නමුත් ඉහත ඉඩම සඳහා නිතිමය ලියවිල්ලක් රජයෙන් ලබා ගෙන නොතිබුණි.

2003 දී ශ්‍රී ලංකා රජය ලංකා ඉන්දියන් තෙල් සමාගම සහ සංස්ථාව සමඟ ගිවිසුමට එළඹ තිබූ අතර, ගබඩා පහසුකම් සහ ඉඩම වර්ෂ 35 ක කාල පරිච්ඡේදයකට ලංකා ඉන්දියන් තෙල් සමාගමට බදු දීමට සංස්ථාව එකඟ වී තිබුණු අතර එම ගිවිසුමට එළඹි දින සිට මාස 06ක් ඇතුළත කල්බදු ගිවිසුම ක්‍රියාත්මක කළ යුතුව තිබුණි. කෙසේ වුවද, සංස්ථාව මෙතෙක් කිසිදු කල්බදු ගිවිසුමකට එළඹ නොතිබුණි.

1942 වර්ෂයේදී යුද්ධය හේතුවෙන් එක් තෙල් ටැංකියක් සම්පූර්ණයෙන් විනාශ වී තිබුණි. දැනට පවතින 99 ක් වූ මුළුතෙල් ගබඩා ටැංකි අතුරින් ටැංකි 14 ක් ලංකා ඉන්දියන් තෙල් සමාගම විසින් භාවිතා කරනු ලබන අතර ඉතිරි ටැංකි 85 අතහැර දමා තිබුණි. 2015 මාර්තු මාසයේදී ඉන්දීය අග්‍රාමාත්‍යවරයාගේ ශ්‍රී ලංකා සංචාරය අතරතුර ලංකා ඉන්දියන් තෙල් සමාගම හා ලංකා ඛණිජ තෙල් නීතිගත සංස්ථාව එකතු වී චීන වරායේ ඇති ටැංකි සංවර්ධනය කිරීමට එකඟ වී තිබුණි. සංස්ථාව සහ ලංකා ඉන්දියන් තෙල් සමාගම සමග එකාබද්ධව තෙල් ටැංකි මෙහෙයවීමට 2016 ජූලි 13 දින අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලබා දී තිබූ අතර 2016 ජූලි 13 දින පැවැති ආර්ථික කලමණාකරණ අමාත්‍ය මණ්ඩලය(**CCEM**),හවුල් ව්‍යාපාරයක් ලෙස සංවර්ධනය කිරීමට අදාල උපදේශකයකු පත්කර ගැනීමට අනුමැතිය ලබා දී තිබුණි.
සංස්ථාවේ සභාපති මේ සම්බන්ධයෙන් පහත සදහන් පරිදි ප්‍රකාශ කරන ලදී.

***"කොළොන්නාවේ ස්ථාපිත ගබඩාවල පවතින සීමාවන්ට විසඳුමක් ලෙස ත්‍රිකුණාමලය තෙල් ටැංකි යොදාගන්නේ කෙසේද යන්න පිළිබඳව මෙම ගැටළුව සාකච්ඡා කර ඇත. කෙසේ වෙතත්, ඉන්දියාව සහ ශ්‍රී ලංකාව අතර ඇති ද්විපාර්ශ්වික ගිවිසුමට අනුව මෙම ටැංකිවල හිමිකම තීරණය කිරීමට ඛනිජ තෙල් නීතිගත සංස්ථාව වෙත දැනුම් දී තිබේ. ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් ටැංකි 16 ක් නවීකරණය කිරීමට හා ත්‍රිකුණාමලය සිට ආසන්න ප්‍රදේශවලට ඉන්ධන සැපයීම සඳහා සැලසුම් කර ඇති අතර රටේ ඉන්ධන හිඟය අවම කිරීම සහ බෙදා හැරීමේ පිරිවැය අඩු කිරීම සඳහා සෘජු ලෙස දායක වනු ඇත. එකවර ටැංකි කීපයක් හිමිකර ගැනීමට සහ ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දුනහොත්, මාස කිහිපයක් ඇතුළත නල මාර්ගයේ ඉදිකිරීම් හා අදාළ නවීකරණයන් ආරම්භ කිරීමට සංස්ථාව සූදානම්ව සිටී. "***

**(ඉ) ඛනිජ තෙල් සංස්ථාව හා ලංකා ඛණිජ තෙල් තොග ගබඩා පර්යන්ත සමාගම අතර සේවා ගිවිසුම**

ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (CPSTL) සහ සංස්ථාව අතර සේවා ගිවිසුමක් ලබාගත නොහැකි වූ අතර එමනිසා, එකිනෙක ආයතන මඟින් සපයන සේවාවන් පැහැදිලිව අර්ථකථනය කර නොතිබුණි. එසේම, ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම විසින් ඛනිජ තෙල් නිෂ්පාදන නියමිත ගුණත්වයෙන් හා ප්‍රමාණයෙන් සපයන බවට තහවුරු කර ගැනීම සඳහා සංස්ථාව විසින් කාර්යසාධන දර්ශක ඇතුළුව අධීක්ෂණ ප්‍රතිපත්ති හා ක්‍රියා පිළිවෙත් සුදුසු ලෙස සැලසුම් කර ක්‍රියාත්මක කර නොතිබුණි.

**(ඊ) තොග සමාලෝචන කමිටුව**

ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව, ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම (**CPSTL**) ජේසීටී(**JCT**) ඔයිල් බැංකුව හා ලංකා ඉන්දියානු ඔයිල් සමාගම් හා ලංකා විදුලිබල මණ්ඩලයේ සාමාජිකයන් සහ රේඛීය අමාත්‍යාංශයේ නිලධාරියෙකුගෙන් තොග සමාලෝචන කමිටුව සමන්විත වූ අතර, එහි රැස්වීම් සෑම සතියකම පවත්වා තිබුණි. කෙසේ වෙතත් තොග මට්ටම් එනම්, යළි ඇණවුම් මට්ටම, උපරිම මට්ටම, අවම මට්ටම, යළි ඇණවුම් ප්‍රමාණය ආදිය සම්බන්ධයෙන් වාර්තා ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් පවත්වා නොතිබුණි. ලංකා ඛනිජ තෙල් ගබඩා පර්යන්ත සමාගම ඉදිරිපත් කරන ලද තොග පවත්වා ගැනීමේ වාර්තාව පදනම් කරගෙන පමණක් ඛනිජ තෙල් නිෂ්පාදිත ඇණවුම් කළ යුතු ප්‍රමාණය තීරණය කර තිබුණි. ඛනිජ තෙල් නිෂ්පාදිත තොග පවත්වා ගැනීම සම්බන්ධයෙන් වෙනත් කිසිදු වාර්තාවක් සමාලෝචන කාර්යයන් සඳහා ඉහත කමිටුවට ඉදිරිපත් කර නොතිබුණි. කෙසේවුවද 2010 වර්ෂයේ සිට හදුන්වාදුන් පරිගණක ගිණුම්කරණ පද්ධතිය යටතේ නිෂ්පාදනය කිරීමට අදාල අවශ්‍ය තොග සම්බන්ධ වාර්තාවන්ට අදාල අතිරේක දත්ත ලබා ගැනිමට සංස්ථාවට නොහැකි වී තිබුණි.

**(උ) මුතුරාජවෙල පර්යන්තය උපයෝජනය කිරීම**

පෙර විගණන වාර්තාවල අඛණ්ඩව වාර්තා කර තිබුණද ඛනිජ තෙල් නිෂ්පාදිත නිකුත් කිරීමේදී මුතුරාජවෙල පර්යන්තය ප්‍රශස්ථ මට්ටමකින් භාවිතා නොකරන බව අනාවරණය විය. ඒ අනුව කරන ලද ආයෝජනයෙන් පහත සඳහන් ප්‍රතිලාභ සංස්ථාව අත්කර ගෙන නොතිබුණි.

- වරාය ගාස්තු ඉතිරි කර ගැනීම

- නැව් තබා ගැනීමේ කාලය අවම කර ගැනීම
- නැව් ප්‍රමාද ගාස්තු අඩු කර ගැනීම
- බෙදා හැරීමේ පිරිවැය අවම කර ගැනීම
- මානව සම්පත් පිරිවැය අවම කර ගැනීම
- නල මාර්ග මගින් ඉන්ධන මුදා හැරීමේ බෙදා හැරීම් පාඩුව ඉතිරි කර ගැනීම
- බවුසර් මගින් ඉන්ධන ප්‍රවාහනයේ අවහිරතා අඩු කර ගැනීම

**4.3 ධීවර ඉන්ධන සහනාධාර වැඩසටහන**

-------------------------------------------

ඉන්ධන මිල සංශෝධනය කිරීම තුළින් ධීවර කර්මාන්තයට වූ අහිතකර බලපෑම අවම කිරීමේ අරමුණින් රජය විසින් 2012 මාර්තු සිට ධීවර යාත්‍රා හිමියන්ට ඉන්ධන සහනාධාර ලබාදීමේ වැඩසටහනක්, ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ සහයෝගීතාවයෙන් ක්‍රියාත්මක කර තිබුණි. ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව විසින් ඉන්ධන සහනාධාර කූපන්පත් ධීවර යාත්‍රා හිමියන් අතර බෙදාහැර තිබූ අතර,එය 2013 සැප්තැම්බර් සිට නවත්වා තිබුණි. ධීවර කූපන් සඳහා ඉන්ධන නිකුත් කිරීමට සංස්ථාව විසින් බෙදාහරින්නන් තෝරාගෙන තිබූ අතර ඒ අනුව, යාත්‍රා හිමියන් විසින් එම කූපන්පත් ලංකා ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ තෝරාගත් ප්‍රාදේශීය බෙදුම්කරුවන් වෙත ඉදිරිපත් කර ඉන්ධන ලබාගෙන තිබුණි. බෙදුම්කරුවන් විසින් සංස්ථාව වෙත එම කූපන්පත් ඉදිරිපත් කිරීමෙන් අනතුරුව සංස්ථාව විසින් අදාල වටිනාකම බෙදුම්කරුවන්ට පියවීම සිදුකර තිබුණි. ඒ අනුව, සංස්ථාව විසින් දරන ලද වටිනාකම ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුව මඟින් මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. පහත කරුණු නිරීක්ෂණය විය.

(අ) විගණනයට ලැබී ඇති තොරතුරු වලට අනුව ධීවර කූපන් වැඩසටහන යටතේ 2016 දෙසැම්බර් 31 දිනට සංස්ථාව විසින් බෙදුම්කරුවන් වෙත ගෙවා තිබූ වටිනාකම රු. 4,367,320,839 ක් (2015 දෙසැම්බර් 31 දිනට රු.4,371,312,889) විය.කෙසේ වුවත් වාරික තුනක් යටතේ සංස්ථාව විසින් මහා භාණ්ඩාගාරයෙන් රු. 4,549,775,000 ක් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි.

(ආ) සංස්ථාව විසින් රු. 182,454,161 ක් වැඩිපුර ප්‍රතිපූර්ණය කරගෙන තිබූ නමුත් එය මහා භාණ්ඩාගාරය වෙත පියවා නොතිබුණි.

(ඇ) සංස්ථාවේ ධීවර සහනාධාර ක්‍රියාවලිය සම්බන්ධයෙන් පහත දුර්වලතා නිරීක්ෂණය විය

(i) ධීවර කූපන්පත් සඳහා ලබා ගත යුතු ඉන්ධන ප්‍රමාණය ධීවර යාත්‍රා හිමියන් විසින් ලබා ගෙන නොතිබූ අතර ඒ වෙනුවට ඔවුන් විසින් සහනාධාර කූපන්පතේ මුහුණත වටිනාකමට(සහනාධාරයට) සමාන ඉන්ධන ප්‍රමාණයක් පමණක් ලබාගෙන තිබුණි.

(ii) ධීවර යාත්‍රා හිමියන් විසින් තෙල් ලබාගැනීම වෙනුවට ඉන්ධන කූපන්පත් වට්ටම් කර බෙදුම්කරුවන් වෙතින් මුදල් ලබාගෙන තිබුණු අතර බෙදුම්කරුවන් විසින් එම කූපන්පත් සංස්ථාව වෙත ඉදිරිපත් කර කූපන්පත්වල සම්පූර්ණ වටිනාකම ප්‍රතිපූර්ණය කර තිබුණි.

(iii) ප්‍රතිපූරණය කළයුතු මුදලට වඩා වැඩිපුර බෙදුම්කරුවන්ගේ ගිණුම් වලට මුදල් බැර කර තිබූ අවස්ථා තිබුණි. නියැදි පරීක්ෂාවට අනුව 2015 දෙසැම්බර් 31 දිනට ප්‍රතිපූරණය කළයුතු මුදලට වඩා වැඩිපුර රු. 9,759,350 ක් බෙදුම්කරුවන්ගේ ගිණුම් වලට බැරකර තිබුණි. කෙසේ වෙතත්, මේවායින් කොටසක් පසුව අයකරගෙන තිබුණි.

(iv) සමහර අවස්ථාවල ධීවර කූපන්පත් ලබාගැනීමකින් තොරව බෙදුම්කරුවන්ගේ ගිණුම් වලට මුදල් බැරකර තිබුණු අතර පසුව ඒ සඳහා හිලව් කිරීමට කූපන්පත් ඉදිරිපත් කර තිබුණි. එවැනි අවස්ථාවක් නම්, සංස්ථාව විසින් රු. 24,310,000 ක වටිනාකමක් බෙදුම්කරුවන්ගේ ගිණුම්වලට බැරකර මාස 01 සිට මාස 12 දක්වා කාලයක් තුල ජර්නල් සටහන් මගින් නිවැරදි කර හෝ පසුව ලැබෙන කූපන්පත් වලින් හිලව් කරගෙන තිබුණි.

(ඈ) ධීවර කූපන්පත් වලට තෙල් බෙදාහැරීම සඳහා නුසුදුසු බෙදුම්කරුවන් තෝරාගෙන තිබූ අවස්ථා නිරීක්ෂණය විය. උදාහරණ ලෙස, මාතර වෙරළ සිට කිලෝ මීටර් 24 ක් දුරින් හක්මන ප්‍රදේශයේ පිහිටා ඇති ඉන්ධන පිරවුම්හලක් ධීවර කූපන් සඳහා තෙල් බෙදාහැරීමට තෝරාගෙන තිබුණි.

(ඉ) ධීවර යාත්‍රා හිමියන්ට සත්‍ය වශයෙන් නිකුත් කළ සහනාධාර කූපන්පත් වටිනාකම හා බෙදුම්කරුවන් විසින් සංස්ථාව වෙත මුදල් ලබාගැනීම සඳහා ඉදිරිපත් කළ කූපන්පත් වටිනාකම අතර වෙනස රු. 85,878,751 ක් විය.

(ඊ) බෙදුම්කරුවෙකු වෙත පියවන ලද ඉන්ධන බිල්පත් වටිනාකම් පිළිබඳව සිදුකළ පරීක්ෂණයකදී පහත අඩුපාඩු නිරීක්ෂණය විය.

(i) ධීවර හා ජලජ සම්පත් දෙපාර්තමේන්තුවේ ධීවර කූපන් ක්‍රමවේදය අනුව, බෙදුම්කරුවන්ට වෙනත් දිස්ත්‍රික්කයක ධීවර යාත්‍රා හිමියන්ට තෙල් නිකුත් කිරීමට නොහැකි විය. එසේ වුවත් ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ පිහිටුවා තිබූ ඉහත බෙදුම්කරුගේ පිරවුම්හල, ඔහු විසින් මුලතිව් හා යාපනය දිස්ත්‍රික්කවල ධීවර යාත්‍රා හිමියන්ගේ ධීවර කූපන්පත් වට්ටම් මුදලකට ලබාගෙන (තෙල් නිකුත් නොකර), මුදල් ලබාගැනීම සඳහා සංස්ථාව වෙත ඉදිරිපත් කර තිබුණි. ඒ අනුව රු. 17,508,875 ක වටිනාකමකින් යුතු ධීවර කූපන්පත් මුදල් ලබාගැනීම සඳහා සංස්ථාව වෙත ඉදිරිපත් කර තිබූ නමුත් සංස්ථාව විසින් එම මුදල් පියවා නොතිබුණි. තවද 2016 ජූනි 30 දිනට රු. 6,281,250 ක් වටිනාකමැති කූපන්පත් සංස්ථාව භාර නොගැනීම නිසා බෙදුම්කරු භාරයේ රඳවාගෙන තිබුණි.

(ii) මේ සම්බන්ධව සිදු කළ අභ්‍යන්තර විගණන විමර්ශනයට අනුව, මෙම බෙදුම්කරු ඉදිරිපත් කළ රු.2,658,015ක් වටිනාකමැති ව්‍යාජ කූපන්පත් වෙනුවෙන් සංස්ථාව මුදල් ගෙවා තිබුණි. කෙසේ නමුත් සංස්ථාව විසින් මෙයට වගකිවයුතු නිළධාරීන් සම්බන්ධව කිසිදු විමර්ෂණයක් ආරම්භ කර නොතිබුණි.

**4.4 ඉදිරි සුරැකුම් ගණුදෙනු**

ක්‍රියාත්මක කරන ලද විගණන පරික්ෂාවන්ට අනුව, 2007 සිට 2009 දක්වා වූ කාල සීමාව තුල සිදු කරන ලද තෙල් මිලදී ගැනීම් වලට අදාලව සිදු කළ ඉදිරි සුරැකුම් ගණුදෙනු හේතුවෙන් 2016 දෙසැම්බර් 31 දිනට රටට දැරීමට සිදු වූ පාඩුව රු.මිලියන 14,028කි.

මේ සම්බන්ධයෙන් පහත නිරීක්ෂණයන් අනාවරණය විය.

(අ) ඉහත සඳහන් කළ පරිදි සංස්ථාව විසින් ඉදිරි සුරැකුම් ගිවිසුම් සඳහා බේරුම් කරන ක්‍රියාවලියට අදාලව වාණිජ බැංකු කිහිපයක් සමඟ ගිවිසුම් වලට එළැඹ ඇති අතර, 2013 ජූනි 03 දින ස්ටැන්ඩඩ් චාර්ඩඩ් බැංකුව වෙත ඇ.ඩො.මිලියන 60ක් (රු.මිලියන 7,713ක්) හා 2016 අගෝස්තු 04 දින **Deutsch AG** බැංකුව වෙත ඇමරිකන් ඩොලර් මිලියන 27ක් (රු.මිලියන 3,881) ගෙවමින් පාර්ශවයන් දෙක අතර ඔප්පු නිරාකරණය කිරීමට එළඹ විගණනයට සැපයූ තොරතුරු අනුව, 2016 දෙසැම්බර් 31 දිනට සංස්ථාවට දැරීමට සිදු වූ අලාභය රු.මිලියන 13,641 ක් විය.

(ආ) 2011 සිට 2014 වර්ෂය දක්වා ශ්‍රී ලංකා මහ බැංකුව විසින් රු.මිලියන 941.2 ක මුදලක් ඉදිරි සුරැකුම් ගණුදෙනු වලට අදාල නීති වියදම් ලෙස දරා ඇති අතර, ශ්‍රී ලංකා මහ බැංකුව විසින් දැරූ රු.මිලියන 567.5ක මුදලෙන් රු.මිලියන 370.6 ක් සංස්ථාවෙන් ප්‍රතිපූර්ණය කරගෙන තිබුණි. කෙසේ වෙතත් රු.මිලියන 3.1 මුදලක් 2016 දෙසැම්බර් 31 වන විටද ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ඇ) තවද, කොමර්ෂල් බැංකුව විසින් කොළඹ වානිජ මහාධිකරණයේ ඇමරිකන් ඩොලර් 8,648,300 අය කර ගැනීමට නඩුවක් ගොනු කර තිබුණි.

(ඈ) 2008 වර්ෂයේ සිට අනිවාර්ය නිවාඩු යැවූ නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මූල්‍ය) සම්බන්ධව විධිමත් විමර්ෂණයක් ක්‍රියාත්මක කිරීමෙන් අනතුරුව ඔහුගේ සේවය 2016 අගෝස්තු **04** අවසන් කරන ලදි. කෙසේ වෙතත් සංස්ථාව විසින් මෙම ගණුදෙනු සඳහා වගකිවයුතු පුද්ගලයන්ට එරෙහිව වෙනත් විමර්ෂණයක් අරඹහ කර නොතිබුණි.

## 4.5 දඩ මුදල් ගෙවීම

පෙර වර්ෂයේ විගණන වාර්තාවේ වාර්තා වූ පරිදි සංස්ථාව විසින් 2014 ජූනි 20 දින නැව් තෙල් මෙහෙයුම් කටයුතු ආරම්භ කිරීම උදෙසා මහා භාණ්ඩාගාරයෙන් ප්‍රතිපූර්ණය කර ගැනීමේ පදනම යටතේ 2002 වසරේ සිට ගෙවිය යුතු ශේෂයක්ව පැවති රු 57,736,913 ක් රේගු දෙපාර්තමේන්තුවට ගෙවා තිබුණි. කෙසේ වෙතත් රේගු දෙපාර්තමේන්තුව විසින් මෙම ගෙවීම දඩ මුදලක් ලෙස හඳුනාගෙන තිබුණි. මේ සම්භන්ධයෙන් පහත නිරීක්ෂණයන් කෙරේ.

(අ) මෙම විගණන වාර්තාවේ දිනය වන විටත් සංස්ථාව විසින් ගෙවූ වටිනාකම මහා භාණ්ඩාගාරයෙන් හෝ තෙල් සපයන ව්‍යාපාර ප්‍රතිපූර්ණය කර නොතිබුණි.

(ආ) ලැබී ඇති තොරතුරු වලට අනුව මෙම ගෙවීමෙන් සියයට 50 ක් හෝ රු 28,868,456 ක් රේගු නිළධාරීන් අතර බෙදා දී තිබූ අතර තවත් සියයට 20 ක් හෝ රු 11,547,383 ක් රේගු නිළධාරීන්ගේ සුභසාධක අරමුදලට බැර කර තිබූ බව නිරීක්ෂණය විය.

(ඇ) රාජ්‍ය ආයතන අතර මෙවැනි ආකාරයේ ගනුදෙනු හිලවු කර ගැනීමට අවස්ථාව පැවතියත් රේගු ආඥා පනතේ 154 හා 165 වගන්ති වලට අනුව සංස්ථාව විසින් මේ වෙනුවෙන් කිසිදු අභියාචනයක් ඉදිරිපත් කර නොතිබුණි.

## 4.6 මෙහෙයුම් අකාර්යක්ෂමතා

### 4.5.1 පිරිපහදුවේ ක්‍රියාකාරීත්වය

1969 වර්ෂයේදී ස්ථාපිත, වර්ෂ 47 ක් පැරණි වූ මෙම පිරිපහදුවෙන් රටේ වැඩිවන ඛණිජතෙල් නිෂ්පාදිත අවශ්‍යතාවය සැපයීමට නොහැකි වී ඇති අතර, ඉතා අඩු පිරිවැයකට ඉන්ධන නිපදවීම සඳහා පහසුකම් ඇති සහ එමගින් පිරිපහදු මෙහෙයුම් කාර්යක්ෂමව උපරිම කිරීමට හැකිවන වෙනත් නවීන ලෝකයේ උසස් තාක්ෂණයන් සහිතව පහළ නිෂ්පාදන තුලින් පෙට්‍රල්, ඩීසල් වැනි ඉහළ වටිනාකම් ඇති නිෂ්පාදන ලබා ගැනීමට හැකි වන පරිදි මෙහෙයුම් කෙරෙන පිරිපහදු සමඟ සැසඳීමේ දී මෙම පිරිපහදුව ඉතා අඩු කාර්යක්ෂමතාවයකින් මෙහෙයුම් සිදු කෙරේ. කෙසේ වුවද, පිරිවැය ඵලදායිතා ආකාරයෙන් ඛණිජ තෙල් නිෂ්පාදිත වෙළඳපොළට සැපයීම තහවුරු කර ගැනීම සඳහා යෝජිත සපුගස්කන්ද තෙල් පිරිපහදුව පුළුල් කිරීම හා නවීකරණය කිරීමේ ව්‍යාපෘතිය **(SOREM)** ක්‍රියාත්මක කිරීමට සංස්ථාවට මෙතෙක් නොහැකි වී ඇත. මෙම අරමුණ සඳහා මූලික ශක්‍යතා අධ්‍යයනය අවසන් වී ඇති අතර අවශ්‍ය ඉඩම් ප්‍රමාණය (අක්කර 35) අත්පත් කර ගෙන ඇති නමුත් මෙම ව්‍යාපෘතිය

ආරම්භ කිරීම සඳහා ප්‍රමාණවත් මූල්‍ය ශක්තියක් නොමැති වීම හේතුවෙන් සංස්ථාවට මෙම ව්‍යාපෘතිය ආරම්භ කිරීමට නොහැකි වී ඇත. පිළි ගෙවුම් කාලය වසර අටකට සහ පිරිවැය එක්සත් ජනපද ඩොලර් බිලියන 2.1 කට ඇස්තමේන්තු කර ඇති මෙම ව්‍යාපෘතියේ ශුද්ධ වර්තමාන අගය එක්සත් ජනපද ඩොලර්.1,535 ක් විය හැක. තවද, සංස්ථාව මෙම ව්‍යාපෘතිය වෙනුවෙන් වියදම් වශයෙන් දරන ලද, 2016 දෙසැම්බර් 31 දිනට දේපළ පිරියත හා උපකරණ යටතේ වත්කම් හා ප්‍රාග්ධන ව්‍යාපෘතිවල නොනිමි වැඩ වශයෙන් දක්වා තිබූ රු. මිලියන 837ක මුදල අනාර්ථික ගනුදෙනුවක් බව නිරීක්ෂණය විය.

### 4.5.2 පිරවුම්හල් අධීක්ෂණය කිරීම

----------------------------------

ප්‍රමාණ ශෝධනය (**Calibration**) කිරීමේ නිරවද්‍යතාව පරීක්ෂා කිරීමෙන් අනතුරුව මිනුම් ඒකක, ප්‍රමිති හා සේවා දෙපාර්තමේන්තුව (**MUSSD**) සහ ඛනිජ තෙල් නීතිගත සංස්ථාව විසින් බෙදා හැරීමේ පොම්ප මුද්‍රා තැබීමට පියවර ගත යුතු වුවත් මෙම කාර්යය නිසි පරිදි සිදු කර නොමැති බව හෙළි වී තිබුණි. එහි ප්‍රතිඵලයක් ලෙස, විගණනයේදී, බොහෝ අවස්ථාවලදී බෙදාහැරීමේ පොම්ප හරහා නියමිත අවම ප්‍රමාණය වන **0.25** ට වඩා අඩුවෙන් ඉන්ධන නිකුත් කර තිබූ බව නිරීක්ෂණය විය.

ප්‍රාදේශීය සුපරීක්ෂකවරුන් විසින් පිරවුම්හල් අධීක්ෂණය ප්‍රමාණවත් ලෙස සිදු කර නොතිබුණි. එනම්, දිගු කාල සීමාවක් තිස්සේ ප්‍රාදේශීය අධීක්ෂකයකු පිරවුම්හල් වෙත නොපැමිණීම, කැඩුණු වායු පොම්පය දිගු කාල සීමාවක් තිස්සේ සකස් කිරීම සඳහා ක්‍රියා කර නොතිබීම, දෛනික විකුණුම් වාර්තා නිසියාකාරව අධීක්ෂණය කර නොමැති වීම සහ සිල්ලර ශාඛා පරීක්ෂක වාර්තාව (**Retail Outlet Inspection Report**) නිසියාකාරව සකස්කර නොතිබීම ආදිය වේ.

### 4.6. වත්කම් කළමනාකරණය

-----------------------------

පහත සඳහන් වත්කම් අත්පත්කර ගත් දින සිටම නිශ්කාර්යව පැවතුණි.

(අ) **වනාතමුල්ලේ පිහිටි හල්ගහකුඹුර ඉඩම -** එල්පී ගෑස් ව්‍යාපෘතිය සහ ක්‍රීඩා භූමියක් සඳහා රු.මිලියන 10.6කට මෙම ඉඩම අත්කර ගෙන තිබුණි. එසේ වුවත්, මෙම ඉඩම නීති විරෝධී පදිංචිකරුවන් (දූර්වාසීන්) 700 කට වඩා අත්පත් කර ගෙන තිබුණි.

(ආ) **මාහේන ඉඩම -** ලබා ගත හැකි වූ ලියවිලි අනුව, සංස්ථාව විසින් මෙම ඉඩම අත්පත් කර ගැනීමට රු. මිලියන 0.625ක මුදලක් ගෙවා තිබුණි. කෙසේ වුවද, මෙම ඉඩම සංස්ථාවේ පොත්වල ගිණුම්ගත කර නොතිබූ අතර 1986 වර්ෂයේ සිට එය පෙර අයිතිකරු විසින් භාවිතා කරමින් පැවතුණි.

(ඇ) **ආයෝජන -** 2016 දෙසැම්බර් 31 දිනට කොටස් වෙළඳපළේ ලියාපදිංචි කළ හා ලියාපදිංචි නොකළ සමාගම් හතරක සිදුකර තිබුණු ආයෝජනයෙහි ධාරණ අගය රු. මිලියන **35.125**ක් විය. කෙසේ වෙතත් දිගු කාලයක සිට මේවායින් කිසිදු ලාභාංශයක් සංස්ථාවට ලැබී නොතිබුණි. තවද, රු. මිලියන 5ක් ආයෝජන කර ඇති ජාත්‍යන්තර ඛනිජ තෙල් සමූපකාර සංගමයේ පැවැත්ම පිළිබඳව සාක්ෂි ලබාගත නොහැකි විය.

### 4.7 අනෙකුත් ආයතන සඳහා මුදා හරින ලද සම්පත්

------------------------------------------------------------

යහපාලනය උදෙසා වූ රාජ්‍ය ව්‍යාපාර මාර්ගෝපදේශ සංග්‍රහයේ 2003 ජූනි 02 දිනැති අංක **PED/12** දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ 2004 ජනවාරි 08 දිනැති අංක 21 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය සහ අතිගරු ජනාධිපති නිකුත් කළ 2006 ජනවාරි 04 දිනැති අංක **CSA/PI/40** හා 2010 මැයි අංක **CS/1/17/1** දිනැති ලිපිය මගින් දක්වා ඇති උපදෙස්වලට පටහැනිව සංස්ථාව විසින් පහත සම්පත් වෙනත් ආයතන වෙත නිදහස් කර තිබූ අතර සැලකිය යුතු මුදල් ප්‍රමාණයක් පාරිතෝෂික සහ අනෙකුත් දීමනා නිදහස් කළ කාර්ය මණ්ඩලයට සහ වාහන සඳහා ඉන්ධන හා නඩත්තු වියදම් දරා තිබුණි. විස්තර පහත පරිදි වේ.

| | සංස්ථාව විසින් දරන ලද වියදම | | | නිදහස් කළ සම්පත් ප්‍රමාණය | | |
|---|---|---|---|---|---|---|
| | **2016** | **2015** | **2014** | **2016** | **2015** | **2014** |
| | රු. | රු. | රු. | | | |
| මානව සම්පත් | 8,531,754 | 3,452,737 | 46,261,907 | 9 | 11 | 56 |
| වාහන | 20,613 | 641,375 | 3,695,910 | 2 | 3 | 7 |
| **එකතුව** | **8,552,367** | **4,094,112** | **49,957,817** | **11** | **14** | **63** |

## 4.8 මානව සම්පත් කළමනාකරණය

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

**(අ) පුරප්පාඩු පිරවීම**

සංස්ථාවේ අනුමත සේවක සංඛ්‍යාව 3284 ක් වුවත් 2016 දෙසැම්බර් 31 දිනට පුරප්පාඩු 722ක් හෝ සියයට 22 ක් පැවතුණි. එම පුරප්පාඩු අතරින් තනතුරු 135 ක් හෝ සියයට 30ක් විධායක මට්ටමේ තනතුරු වූ අතර එයට නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි(තාක්ෂණික සේවා සහ ආයතනික කටයුතු ) නියෝජ්‍ය පිරිපහදු කළමණාකරු (නඩත්තු හා ව්‍යාපෘති ), ප්‍රධාන අභ්‍යන්තර විගණක ආදී තනතුරු ඇතුලත් වේ. ඒ අනුව සංස්ථාවේ ඉහල කලමණාකාරිත්වයේ ප්‍රධාන තනතුරු මාස 7 සිට මාස 46 දක්වා පරාසයක පුරප්පාඩුව පවතී. ඊට අමතරව කළමණාකරු (ලේකම් /අධ්‍යක්ෂක මණ්ඩල ලේකම්) 2012 වර්ෂයේ සිට පුරප්පාඩුව පවතී. එබැවින් දීර්ඝ කාලයක සිට ඉහල කළමනාකරණයේ ප්‍රධාන තනතුරු පියවීම සඳහා හිතකර පියවර නොගැනීම විගණනයට ගැටළු සහගත විය.

**(ආ) 2016 වර්ෂය තුල බඳවා ගැනීම්**

2017 අප්‍රේල් 04 දිනැති අංක එම්පිආර්ඩී/අයිඒ/2/6(1) දරන ලිපිය මගින් පොදු ව්‍යාපාර පිලිබඳ කාරක සභාව (කෝප්) වෙත විගණකාධිපතිට පිටපතක් සහිතව ලබා දී ඇති තොරතුරු අනුව 2016 වර්ෂයේදී සම්පූර්ණ බඳවා ගැනීම් 98ක් ලෙස දක්වා තිබුණද සත්‍ය බඳවා ගැනීම් 94ක් පමණක් විය.ඒ අනුව **COPE** වෙත ඉදිරිපත් කර තිබූ වාර්තාව. එමනිසා**,** කෝප් කමිටුවට ඉදිරිපත් කළ වාර්තාවේ සඳහන් වන මෙම තනතුරු තුනට අදාල බඳවා

ගැනීම් 17 සඳහන් නොවූ අතර බඳවා ගැනීම් **21**ක් වැඩියෙන් දක්වා තිබුණි.
එබැවින් කෝප් කමිටුවට ඉදිරිපත් කළ තොරතුරු වල නිවැරදිතාවය පිළිබඳව විගණනයට සැකසහිත විය.

**(ඇ) බඳවා ගැනීම් සඳහා ප්‍රචාරණය**

බඳවා ගැනීමේ හා උසස් කිරීම් සඳහා වන නිර්ණායක හා ලකුණුදීමේ පරිපාටි සංශෝධන 3 අනුව (අධ්‍යක්ෂ මණ්ඩලය විසින් 2015 මැයි 26 දින අනුමත කළ 1/1163 අනුව) සියලු අභ්‍යන්තර හා බාහිර දැන්වීමේ **A-1** හෝ ඊට වැඩි ශ්‍රේණි සඳහා මානව සම්පත් කළමනාකරුගේ කාර්යයන් යටතේ සහ සභාපති හෝ කළමනාකරණ අධ්‍යක්ෂකගේ අත්සනින් යුතුව නිකුත් කළ යුතු අතර **A-2** සහ ඊට ශ්‍රේණි සඳහා නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් සහ පරිපාලන) හෝ මානව සම්පත් කළමනාකරුගේ අත්සන යටතේ දැන්වීම් නිකුත් කළ යුතුය.

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

**(I)** සංස්ථාවේ වෙබ් අඩවියේ ඉහත පටිපාටියට පටහැනිව පුරප්පාඩු කිහිපයක් ප්‍රචාරණය කර තිබුණි. තව දුරටත් සංස්ථාවේ සභාපති විසින් තොරතුරු තාක්ෂණික කළමණනාකරු වෙත කිසිදු යොමු කිරීමක් නොකර කෙලින් ම දත්ත විශ්ලේෂක ( තොරතුරු තාක්ෂණ අංශය) වෙත දෙන ලද වාචික උපදෙස් මත බොහෝ දැන්වීම් වෙබ් අඩවියෙහි ප්‍රචාරණය කිරීම හා ඉවත් කිරීම සිදුකර තිබුණි.

**(II)** පුරප්පාඩු වෙබ් අඩවියේ ප්‍රචාරණය කර තිබුණත් එම දැන්වීම බැලීමට සහ ඉල්ලුම් කිරීමට ප්‍රමාණවත් කාලයක් ප්‍රදර්ශනය කර නොතිබුණි. සමහර දැන්වීම් වෙබ් අඩවියේ පැය 3 හෝ 5 කට වඩා අඩු කාලයක් ප්‍රදර්ශනය කර තිබුණු බව අනාවරණය විය. එබැවින් ඉහත තනතුරු වලට සුදුසු පුරවැසියකුට අයදුම් කිරීමට සමාන අවස්ථාවන් වලක්වා තිබුණි.

**(III)** 2016 පෙබරවාරි 29 දින සිංහල පුවත්පත් දැන්වීම් අනුව සංස්ථාව ඉදිරි සියලු අනාගත පුරප්පාඩු දැන්වීම් අනුව සංස්ථාව ඉදිරි සියලු අනාගත පුරප්පාඩු දැන්වීම් සංස්ථාවේ වෙබ් අඩවියේ පමණක් පළ කරන බව දන්වා තිබුණි.කෙසේ වෙතත් බඳවා ගැනීම් සඳහා වූ දැන්වීම් අයදුම් කිරීමට තිබූ අවසන් දිනට පෙර වෙබ් අඩවියෙන් ඉවත් කර තිබුණි.උදාහරණයක් ලෙස සාමාන්‍ය කම්කරු සඳහා වූ දැන්වීම් 2016 ජූලි 04 දින ඉවත් කර තිබුණත් එහි අවසන් දිනය ලෙස සඳහන් වූයේ 2016 ජූලි 13 දිනය.

**(ඈ) කළමනාකාරණ සහකාර බඳවා ගැනීම (ගිණුම් හා විගණන)**

2017 ජනවාරි 01 දින සංස්ථාව විසින් කළමනාකරණ සහකාර ( ගිණුම් හා විගණන) 19 දෙදෙනෙකු බඳවා ගෙන තිබුණි.පහත සඳහන් කරුණු මේ සම්බන්ධයෙන් අනාවරණය විය.

**(i)** කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ (**MSD**) පූර්ව අනුමැතියකින් තොරව එම කළමනාකරණ සහයකයින් බඳවා ගෙන තිබුණි.

**(ii)** සංස්ථාවේ බඳවා ගැනීමේ සහ උසස් කිරීමේ පටිපාටිය (**SORAP**) බී-3 ශ්‍රේණි සඳහා වන කොන්දේසි වලට පටහැනිව කිසිදු ලිඛිත විභාගයකින් තොරව මෙම බඳවා ගැනීම සිදු කර තිබුණි.

**(iii)** සංස්ථාවේ සභාපති විසින් නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (මානව සම්පත් හා පරිපාලන) හරහා මානව සම්පත් කළමනාකරු වෙත 2016 ඔක්තෝබර් 02 දිනැති ලිපිය මඟින් මෙම බඳවා ගැනීම්, සම්මුඛ පරීක්ෂණයක් මත බඳවා ගන්නා ලෙස දන්වා තිබුණි. කෙසේ වෙතත් 2013 දෙසැම්බර් 11 දිනැති ගැසට් නිවේදන අංක 1840/34 අනුව හා සංස්ථාවේ බඳවා ගැනීමේ හා උසස්කිරීමේ ක්‍රියාපටිපාටිය අනුව කළමනාකරණ සහකාර තනතුර සඳහා වන බාහිර බඳවා ගැනීම් සඳහා ලිඛිත පරිෂණයක් පැවැත්විය යුතුය.

**(iv)** සංස්ථාවේ බඳවා ගැනීමේ හා උසස්කිරීමේ ක්‍රියාපටිපාටිය ඉල්ලා ඇති පරිදි තෝරා ගනු ලබන නිලධාරීන්ගේ අදාල ක්ෂේත්‍රයන්හි වසර පහක පළපුරුද්ද තහවුරු කර ගැනීම සඳහා ලිඛිත සාක්ෂි විගණනයට ඉදිරිපත් නොවීය.

**(v)** අයදුම්කරුවකු විසින් සේවා සහතික දෙකක් විවිධ ආයතනයන්හි එකම කාල පරිච්ඡේදයකට අදාල ව ලබා තිබුණු බව අනාවරණය විය.තවදුරටත් සංස්ථාව විසින් තෝරාගනු ලැබූ අයදුම්කරුවන් ඉදිරිපත් කළ සේවා සහතික වල නිවැරදිතාවය පිළිබඳව සනාථ කර ගෙන නොතිබුණි.

**(vi)** සංස්ථාවේ බඳවා ගැනීමේ හා උසස්කිරීමේ පටිපාටිය අනුව අධ්‍යාපන හා වෘත්තිය සුදුසුකම් සහතිකපත් අදාල ආයතන තුලින් බඳවාගත් දින සිට මාස 6ක් ඇතුලත තහවුරු කර ගත යුතුය. කෙසේවෙතත් 2017 ඔක්තෝබර් 30 දින විටත් එසේ තහවුරු කර ගැනීමක් සිදුකර නොතිබුණි.

**(ඉ) සාමාන්‍ය කම්කරු බඳවා ගැනීම**

ඉදිරිපත් කරන ලද තොරතුරුවලට අනුව ඉහත තනතුරු සඳහා අයදුම්පත් 6853 ක් ඉල්ලුම් කර තිබූ අතර ඉන් 156 දෙනෙකු පමණක් සම්මුඛ පරීක්ෂණයට කැඳවා තිබුණි. කෙසේ වෙතත් අයදුම්පත් කෙටි ලැයිස්තුගත කිරීමේ පදනම විගණනයට ඉදිරිපත් නොකෙරිණි. තවදුරටත් ප්‍රචාරණය දැන්වීමේ ලිඛිත විභාගයක් පවත්වා බඳවා ගැනීම් සිදු කරන බව දක්වා තිබුනත් කිසිදු ලිඛිත විභාගයක් පවත්වා නොතිබුණි. සංස්ථාවේ කළමණාකරණ අධ්‍යක්ෂක විසින් මේ සම්බන්ධයෙන් පහත ප්‍රකාශය ඉදිරිපත් කරන ලදි.

“ සංස්ථාවට 2016 ජුලි 13 දිනට අයදුම්පත් 6853 ක් ලැබී තිබුණි. පුරප්පාඩු 18ක් පිරවීම සඳහා විශාල අයදුම්පත් ප්‍රමාණයක් සලකා බැලිම ප්‍රායෝගික නොවන නිසාත්, වෙනත් ප්‍රායෝගික විසඳුමක් නොමැති නිසාත් හිටපු සභාපති/ කළමණාකරන අධ්‍යක්ෂකගේ උපදෙස් මත පළමු දින 04 තුල ලැබූ අයදුම්පත් වලින් අයදුම්පත් 156ක් සලකා බලන ලෙස උපදෙස් දෙන ලදි”.

**(ඊ) පුහුණුව**

සංස්ථාව විසින් අනුමත විදේශ පුහුණු ප්‍රතිපත්තියක් හා මාර්ගෝපදේශයක් මෙම විගණන වාර්තාවේ දිනවන විටත් හඳුන්වා දී නොතිබුණි. එම නිසා සංස්ථාව විසින් අවිධිමත් පදනමක් මත දේශිය හා විදේශිය පුහුණුවීම් සඳහා නිලධාරීන් තෝරා ගන්නා බව අනාවරණය විය. ඛනිජ තෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ (**MPRD**) , 2017 මාර්තු 29 දිනැති අංක **MPRD/ADM/15/02/40 (com)** ලිපිය අනුව විදේශ පුහුණුවීම් සම්බන්ධයෙන් ඇති ගැටළු නිවැරදි කර ගන්නා ලෙස සංස්ථාවේ කළමනාකරණයට උපදෙස් ලබා දී තිබුණි.

**4.9 මතභේදයට තුඩු දෙන ගනුදෙනු**

4.9.1 **මහා භාණ්ඩාගාරයට අරමුදල් මාරු කිරීම**

මුදල් අමාත්‍යාංශය විසින් සිදු කළ ඉල්ලීමකට අනුව, වර්ෂයකට රු.මිලියන 10,000 බැගින් 2014 සහ 2016 වර්ෂ තුලදී මුළු එකතුව රු. මිලියන 20,000ක් සංස්ථාව විසින් මහා භාණ්ඩාගාරයට ගෙවා තිබුණි.

2014 වර්ෂයේ දී ගෙවූ ඉහත සඳහන් කළ රු.මිලියන 10,000 2014 වර්ෂය සඳහා රු.මිලියන 250ක්, 2015 වර්ෂය සඳහා රු මිලියන 750ක් සහ 2016 සිට 2024 කාලපරිච්ඡේදය සඳහා වර්ෂයකට රු.මිලියන 1,000 බැගින් වියදමක් ලෙස කපාහැරීමට රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් ඔහුගේ 2014 දෙසැම්බර් 30 දිනැති ලිපිය මඟින් සංස්ථාවට උපදෙස් ලබා දී තිබුණි. කෙසේ නමුත් ඉහත සඳහන් කළ ගිණුම්කරණ පිළිවෙතහි මූල්‍යමය බලපෑම් සැලකිල්ලට නොගෙන, මහා භාණ්ඩාගාරය විසින් දුන් උපදෙස් වලට සංස්ථාව පූර්ණ ලෙස අනුකූල වී තිබුණි.

රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා විසින් 2016 දෙසැම්බර් 16 දින ඔහුගේ ලිපි අංක **PE/RE/SP/2016** මගින් මහා භාණ්ඩාගාරයට බැඳුම්කර නිකුත් කිරීමට බලය දීමට රු මිලියන 10,000ක් ඒකාබද්ධ අරමුදලට ඉතා ඉක්මණින් පැවරීමෙන් සංස්ථාවේ 2017 ශේෂ පත්‍රය ඒ සමාන අගයකින් ශක්තිමත් කිරීම සඳහා සංස්ථාව වෙත උපදෙස් ලබා දීම ඛනිජතෙල් සම්පත් සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්වරයා වෙත දැනුවත් කර තිබුණි.

භාණ්ඩාගාරයේ යෝජනාව අනුව ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කිරීමේ ආකාරය වූ එහි මුදල් ඉවත් කිරීම මඟින් ව්‍යාපාර පවත්වා ගැනීමේ තත්ත්වයක් තුළ මූල්‍ය තත්ත්වය ශක්තිමත් කරනු වෙනුවට රු.බිලියන 186ක් වූ සෘණාත්මක ශුද්ධ වත්කම් තත්ත්වය තව දුරටත් පිරිහී යනු ඇත.

ඉහත ගණුදෙනුව ගිණුම්ගත කිරීමේ ක්‍රමවේදය සම්බන්ධව සංස්ථාව හා රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තුව අතර සන්නිවේදනයන් කිහිපයකින් පසු, අවසානයේ 2017 ඔක්තෝබර් මාසයේ දී සංස්ථාවට උපදෙස් ලබා දී තිබුණේ එය 2016 වර්ෂයේ ලාභයෙන් රජයට ගෙවන ලද ලාභාංශ ලෙස සලකන මෙන් සහ එමෙන්ම 2016 වර්ෂයේ ලාභය මත කිසියම් බදු ප්‍රමාණයක් ඉතිරිව තිබේ නම් වසර 3ක් තුල සමාන මාසික වාරික වලින් ගෙවීමට උපදෙස් ලබා දී තිබුණි.

## 5. ගිණුම්කටයුතුභාවය හා යහපාලනය

---------------------------------------

### 5.1 අභ්‍යන්තර විගණනය

--------------------------

අභ්‍යන්තර විගණනය ඕනෑම ආයතනයක කළමනාකරණයට වැදගත් සේවාවක් සපයයි.

වංචා විමර්ශනය හා අනාවරණය, අභ්‍යන්තර පාලනය පරීක්‍ෂා කිරීම සහ සංවිධාන ප්‍රතිපත්ති සහ රජයේ රෙගුලාසි සමඟ අනුකූලතාවය නියාමනය කිරීම අභ්‍යන්තර විගණනයේ සේවාවන් වේ.එහෙයින් අභ්‍යන්තර විගණන කටයුතු සංවිධානයක සංවර්ධනයෙහිලා වැදගත් කාර්යභාරයක් ඉටු කරයි. මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කෙරේ.

(අ) අභ්‍යන්තර විගණන අංශයේ අනුමත සේවක සංඛ්‍යාව වූ තනතුරු 42 අතරින් තනතුරු 09 ක් හෝ සියයට 21 ක් 2016 දෙසැම්බර් 31 දිනම පුරප්පාඩුව පැවතුණි.ඒ අතරින් තනතුරු 07ක් හෝ සියයට 54ක් ජ්‍යෙෂ්ඨ නිලධාරි මට්ටම්වල විය.

(ආ) සංස්ථාවේ ප්‍රධාන අභ්‍යන්තර විගණක ආයතනයේ අධ්‍යක්ෂක මණ්ඩලය වෙත සෘජුව වගකිව යුතු වුව ද සංස්ථාවේ සංවිධාන සැලැස්මට අනුව ප්‍රධාන අභ්‍යන්තර විගණක සංස්ථාවේ කළමණාකරණ අධ්‍යක්ෂ වෙත සෘජුව වගකියනු ලැබේ.

(ඇ) ඉහත සාධක නිසා සංස්ථාවේ අභ්‍යන්තර විගණන කටයුතු ක්‍රමානුකූලව 2011 වර්ෂයේ මැද භාගයේ සිට අකර්මණ්‍ය වී තිබුණු බව අනාවරණය විය.

## 5.2 අයවැය පාලනය

---------------------

සමාලෝචිත වර්ෂයේ අයවැයගත සහ තථ්‍ය ආදායම හා වියදම අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායි කළමනාකරණ පාලන කාරකයක් ලෙස යොදා ගෙන නොතිබුණි.

## 6. පද්ධති හා පාලනයන්

---------------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර සංස්ථාවේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් කෙරෙහි විශේෂ අවධානය යොමු විය යුතුය.

| ප්‍රධාන ක්ෂේත්‍රය | නිරීක්ෂණ |
|---|---|
| (අ)මානව සම්පත් පාලනය | බඳවා ගැනීම් පරිපාටිය අනුමත කර ගැනීමට අපොහොසත් වීම. |
| (ආ) මූල්‍ය පාලනය | සංස්ථාවේ ප්‍රධාන අරමුණු සඳහා මුදල් යෙදවීම ක්‍රියාත්මක කිරීම ප්‍රමාණවත් පරිදි පවත්වාගෙන ගොස් නොතිබුණි. සංස්ථාවේ ප්‍රධාන අරමුණු ඉටුකර ගැනීමට අරමුදල් භාවිතා කිරීම ප්‍රමාණවත් ආකාරයෙන් පවත්වාගෙන ගොස් නොතිබුණි. |
| (ඇ) වෙළඳ හා වෙනත් ලැබිය යුතු දෑ | නියමිත කාලයේදී හිඟ හිටි මුදල් එකතු කිරීම සහ ණය ගෙවීම් පැහැර හැරීමේ අවධානම අඩු කිරීම සම්බන්ධයෙන් වූ පාලනයන්ගේ දුර්වලතා පැවතීම. |
| (ඈ) ප්‍රසම්පාදනය | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ නියමයන් සමඟ අනුකූල වීම. |
| (ඉ) සම්පත් උපයෝජනය | චක්‍රලේඛ උපදෙස්වලට අනුකූලව සම්පත් ඵලදායීව යෙදවීම. |
| (ඊ) තොරතුරු පද්ධති පාලනය | ප්‍රවර්තන වර්ෂය තුළ පෙර වර්ෂයන් සඳහා SAP පද්ධතිය තුළ ජර්නල් සටහන් කිරීමට නිලධාරීන්ට අවස්ථා පවතින බැවින්, SAP පද්ධතිය තුළ අනෙකුත් මොඩියුල සංශෝධනය කිරීමේ හැකියාව විගණනයේදී බැහැර කළ නොහැකිය. |

තවද, SAP පද්ධතිය තුල එකම ගනුදෙනුකරු නමින් ගිණුම් කිහිපයක් ඇතුලත් කර තිබුණි. එබැවින්, ඛනිජ තෙල් නීතිගත සංස්ථාවේ අභ්‍යන්තර පාලනයන් හා ණය සීමාවන් අවභාවිතය, ණය කාලසීමාව හා අදාළ ණයගැති පාලනයන්ට අදාලව හානි පමුණුවීමට ඇති හැකියාව තිබීම.